සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

**13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026**

**தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026 / Grade 13 Final Term Test - 2026**

| ආර්ථික විද්‍යාව - 1 | 21 | S | 1 | කාලය / நேரம் / Time } පැය 2 |
|---|---|---|---|---|

නම / பெயர் / Name } ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..............................

**උපදෙස්:**

* **සියලුම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** හෝ **නම** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස්ද සැළකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1 සිට 50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ** පිළිතුර තෝරාගෙන, ඒය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන පරිදි කතිරයක් (X)** යොදා දක්වන්න.

1. සම්පත් අධි පරිභෝජනය කිරීම නිසා ගෝලීය වශයෙන් ඇතිවිය හැකි ගැටළුවක් වන්නේ,
   (1) මිනිස් වුවමනා සපුරා ගැනීමට නොහැකි වීම.
   (2) ස්වාභාවික සම්පත් ඉතා වේගයෙන් අඩු වීම.
   (3) මිනිසුන්ට තම අවශ්‍යතා පාලනය කිරීමට සිදුවීම.
   (4) ස්වභාවික විපත් වලට මුහුණ දීමට සිදු වීම.
   (5) අනාගතයේදී ස්වාභාවික සම්පත් පරිභෝජනය නතර කිරීමට සිදුවීම.

2. සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනයට උදාහරණයක් වන්නේ,
   (1) විදුලි බල පද්ධති (2) මහා මාර්ග (3) වාරි මාර්ග ක්‍රම
   (4)පානීය ජල සම්පාදන පද්ධති (5) සන්නිවේදන කුළුණු

3. විධානගත අර්ථක්‍රමයක දුර්වලතාවයක් වන්නේ,
   (1) සම්පත් බෙදීයාම අකාරයක්ෂමතාවය.
   (2) අසමාන ආදායම් ව්‍යාප්තිය.
   (3) සානුබල ප්‍රමාණවත් නොවීම.
   (4) වෙළෙඳ පොළ සම්බන්ධ නිවැරදි තොරතුරු ප්‍රමාණවත් පරිදි ලබා ගත හැකි වීම.
   (5) තරඟකාරිත්වය නිසා සම්පත් නාස්තියක් සිදුවීම.

4. ශ්‍රී ලංකාවේ පැවති නියඟය නිසා ආර්ථික පසු බැසීමක් ඇති වේ නම්, එය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් තුළින් පෙන්නුම් කරනු ලබන්නේ ,
   (1) වක්‍රය දිගේ ඉහළට ගමන් කිරීම.
   (2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වීම.
   (3) වක්‍රය දකුණට විතැන් වීම.
   (4) වක්‍රය මත පිහිටි ලක්ෂය වක්‍රය වම් පසට විතැන් වීම.
   (5) වක්‍රයේ වම්පස පිහිටි ලක්ෂය වක්‍රය ආසන්නයට ගමන් වීම.

Past Papers Wiki

5. ඉල්ලුම් නීතියට අනුකූලව අඳිනු ලබන වමේ සිට දකුණට පහළට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක් උපකල්පනය කරන්න.මෙම වක්‍රය අනුව, භාණ්ඩය සඳහා වන මිල අඩුවන විට. මිල ඉල්ලුම් නම්‍යතාවයට කුමක් සිදු වේ ද?
   (1) ක්‍රමයෙන් අඩු වේ. (2) ක්‍රමයෙන් වැඩි වේ.
   (3)වෙනස් නොවේ. (4) ප්‍රමාණය වැඩිවන බැවින් මිල නම්‍යතාවය ද වැඩි වේ.
   (5) ප්‍රමාණය වැඩිවන නිසා තීරණය අවිනිශ්චිත වේ.

6. තරගකාරී වෙළෙඳ පොළක් සම්බන්ධ පහත ප්‍රකාශ වලින් ඔබට එකගවිය හැකි ප්‍රකාශය කුමක් ද?
   (1) සමතුලිත මිලට වඩා අඩු මිලක දී අධි ඉල්ලුම සෘන අගයක් ගනී.
   (2) සමතුලිත මිලට වඩා අඩු මිලක දී අධි සැපයුම ධන අගයක් ගනී.
   (3) සමතුලිත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක දී දී අධි ඉල්ලුම් මිල සෘන අගයක් ගනී.
   (4) සමතුලිත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක දී දී අධි ඉල්ලුම් මිල සෘන අගයක් ගනී.
   (5) සමතුලිත අවස්ථාවේ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවට බාධා කාරී තත්ත්වයන් හට ගනී.


7. ඉල්ලුම් වක්‍රයක් විතැන් නොවී X භාණ්ඩයේ මිල පහළ යාමට හේතුවක් වනුයේ කුමක් ද?
   (1) අදාළ භාණ්ඩයේ නිෂ්පාදන පිරිවැය වැඩි වීමක්.
   (2) නිෂ්පාදකයින්ට ලබා දුන් සහනාධාර අඩු කිරීමක්.
   (3) පාරිභෝගිකයන්ගේ මූර්ත ආදායම අඩුවීමක්.
   (4) ස්වභාවික හේතුවක් මත භාණ්ඩ බෙදා හැරීමේ අපහසු තාවයක්.
   (5) නිෂ්පාදකයින්ට ලබා දුන් බදු අඩු කිරීමක්.

8. එක්තරා භාන්ඩයක මිල 20% කින් පහළ දමන විට එහි ඉල්ලුම් ප්‍රමාණය 10% කින් වැඩි වූයේ නම්, පහත සඳහන් ප්‍රකාශ වල නිර්වද්‍යතාවය හඳුනාගන්න.
   (1) භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය ඍජු කෝණාස්‍ර බහුවලයකි.
   (2) භාණ්ඩයේ .නිර්වචනය පුළුල් වෙයි.
   (3) භාණ්ඩයට තිබෙන ආදේශක වල සමීපතාවය ඉතා ඉහලින් පවතී.
   (4) භාණ්ඩයේ මිල අඩු කිරීමෙන් නිෂ්පාදකයාගේ අළෙවි ආදායම වැඩි කර ගත හැක.
   (5) භාන්ඩය සුඛෝපභෝගී භාණ්ඩයකි.

9. තරගකාරී වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වයක දී පාරිභෝගික ආදායම ඉහළ ගොස් සෑම මිලක් යටතේම ඉල්ලුම ඒකක 100 කින් වැඩි වූ අතර නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් සෑම මිලකදීම සැපයුම ඒකක 100 කින් අඩුවිය.මෙවැනි තත්ත්වයක් යටතේ වෙළෙඳ පොළ සමතුලිතය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?
   (1) සමතුලිත මිල පහළ යයි.
   (2) සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
   (3) සමතුලිත මිල පිළිබඳව නිශ්චිතව කිව නොහැකි අතර සමතුලිත ප්‍රමාණය අඩු වේ.
   (4) සමතුලිත මිල හා ප්‍රමාණය යන දෙකම වෙනස් වේ.
   (5) සමතුලිත මිල වෙනස් නොවන අතර සමතුලිත ප්‍රමාණය පහළ යයි.

10. එක්තරා භාණ්ඩයක සැපයුම කෙරෙහි බලපාන, සම්බන්ධිත භාණ්ඩයක මිල ( නිෂ්පාදන ආදේශකයක මිල) අඩු වී නම් , ඔබට එළඹිය හැකි නිගමනය කුමක් ද?
   (1) සමතුලිත මිල පහළ යන අතර , සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.
   (2) සමතුලිත මිල ඉහළ යන අතර , සමතුලිත ප්‍රමාණය පහළ යයි.
   (3) සමතුලිත මිල ඉහළ යන අතර , සමතුලිත ප්‍රමාණය ද ඉහළ යයි.
   (4) සමතුලිත මිල වෙනස් නොවන අතර , සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.
   (5) සමතුලිත මිල වෙනස් නොවන අතර , සමතුලිත ප්‍රමාණය පහළ යයි.

11. එක්තරා භාණ්ඩයක අවස්ථා දෙකක සැපයුම් වක්‍ර දෙකක් පහත රූප සටහනෙහි දැක්වේ. ඔබට ඒකඟවිය හැකි ප්‍රකාශය වනුයේ,




**(1)** **$S_1$** සැපයුම් වක්‍රයෙහි මිල ඉහළ යනවිට සැපයුම් නම්‍යතාවය ද වැඩිවේ.
**(2)** **$S_2$** සැපයුම් වක්‍රයෙහි මිල පහළ යනවිට සැපයුම් නම්‍යතාවය ද අඩුවේ.
**(3)** **$S_1$** හා **$S_2$**සැපයුම් වක්‍ර වල සැපයුම් නම්‍යතාවය සමාන වේ.
**(4)** **$S_1$** සැපයුම් වක්‍රයට වඩා **$S_2$** සැපයුම් වක්‍රයේ නම්‍යතාවය අඩු වේ.
**(5)** **$S_2$** සැපයුම් වක්‍රයේ ඕනෑම ලක්ෂ්‍යක නම්‍යතාවය 1 ට වඩා වැඩිවන අතර මිල වැඩි වන විට එකට ආසන්න වෙමින් අඩු වේ.

12. වෙළෙඳපොල මිල රු. 10 ක් වන භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාව - 1.0 සහ සැපයුම් නම්‍යතාව 1.5 වේ. එම භාණ්ඩය මත රජය විසින් රු.5 ක බද්දක් පනවීමෙන් පසු මෙම භාණ්ඩයේ නව වෙළෙඳපොල මිල කොපමණ ද?

   (1) 13 කි. (2) 07 කි. (3) 03 කි.
   (4) 2. 50 කි. (5) 2 කි.

13. සහතික මිල ප්‍රතිපත්තියක් යටතේ රජය අතිරික්තය මිලට ගැනීමට හෝ ඌණ පූරණ ගෙවීම් ක්‍රමයක් හෝ යන ක්‍රම දෙකටම අදාළව නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) පරිභෝගික අතිරික්තය පහළ යයි. (2) පාර්භෝගිකයා ගෙවන මිල ඉහළ යයි.
   (3)ගබඩා පිරිවැයක් දැරීමට සිදු වේ. (4) නිෂ්පාදන අතිරික්තය ඉහළ යයි.
   (5) නිෂ්පාදකයාට ලැබෙන මිල පහළ යයි.


14. භාණ්ඩයක් මත පනවනු ලබන ඒකක බද්දක් හේතුවෙන් , වෙළෙඳ පොළ මිල හා ප්‍රමාණය යන දෙකම ස්ථාවරව පවතී. මෙවැනි තත්ත්වයක් ඇතිවිය හැකි වන්නේ, අනෙකුත් නම්‍යතාව සාමාන්‍ය තත්ත්වයක තිබිය දී

(1) පූර්ණ අනම්‍ය ඉල්ලුමක දීය.
(2) ඒකීය නම්‍ය සැපයුමකදීය.
(3)අනම්‍ය සැපයුමක දීය
(4) පූර්ණ අනම්‍ය සැපයුමක දීය.
(5) අනම්‍ය ඉල්ලුමකදීය.

15. නිෂ්පාදන කාලය සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත්නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ස්ථාවර යෙදවුම් හා විචල්‍ය යෙදවුම් සමග තාක්ෂනය වෙනස් වන කාලය කෙටි කාලය වේ.
(2) සියළුම යෙදවුම් හා තාක්ෂනය වෙනස් වන කාලය දිගු කාලය වේ.
(3) කෙටි කාලය තුළ විචල්‍ය සාධක අනුපාත නීතිය ක්‍රියාත්මක වන අතර තාක්ෂණය වෙනස්ව වේ.
(4) දිගුකාලය තුළ පරිමානානුකූල ඵල නීතිය ක්‍රියාත්මක වන අතර තාක්ෂණය නොවෙනස්ය.
(5) වසරකට අඩු කාලය කෙටි කාලය වන අතර වසරකට වැඩි කාලය දිගු කාලය වේ.

16. . නිෂ්පාදන ආයතනයක පිරිවැය තොරතුරු පහත දැක්වේ. එහි නිමැවුම් ප්‍රමාණය $Q_1$ සිට $Q_2$ දක්වා වැඩි වන විට සාමාන්‍ය පලදාව හා ආන්තික ඵලදාව වෙනස් වන්නේ,




| | සාමාන්‍ය ඵලදාව | ආන්තික ඵලදාව |
|---|---|---|
| (1) | වැඩි වේ. | අඩු වේ. |
| (2) | අඩු වේ. | වැඩි වේ. |
| (3) | අඩු වේ. | අඩු වේ. |
| (4) | සමාන වේ. | වැඩි වේ. |
| (5) | අඩු වේ. | සමාන වේ. |

17. නිෂ්පාදන ආයතනයක මුළු ආදායම රු. 10000/= කි. ඒකකයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 25 කි. නිමැවුම් ඒකක සංඛ්‍යාව ඒකක 250 කි. මීට අනුකූලව ආයකතනයේ නිෂ්පාදන අතිරික්තය හා මුළු විචල්‍ය පිරිවැය පිළිවෙලින්,

(1) 6250 , 3750 (2) 2750 , 7250 (3)8500 , 1500
(4) 3000 , 7000 (5) 3750 , 6250

18. පහත ඉදිරිපත් කර තිබෙන ලක්ෂණ අතුරින් මිල ගණුවෙකු ලෙස ක්‍රියා කරන නිෂ්පාදන ආයතනයකට අනුකූල නොවන ලක්ෂනය වන්නේ,

(1) නිෂ්පාදනය සමජාතීය වීම.
(2) ආයතනයේ ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තර වීම.
(3) ආයතන අතර අන්‍යොන්‍ය රුඳියාවක් නොපැවතීම.
(4) දැඩි ප්‍රචාරණයක් පැවතීම.
(5) වෙළෙඳ පොළ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වීම.

19. පහත සඳහන් දෑ අතුරින් ආර්ථික පසු බැසීමක (ප්‍රතිගමනය) ලක්ෂනයක් වන්නේ,

(1) යෙදවුම් සඳහා ඉල්ලුම වැඩිවීම නිසා යෙදවුම් මිල ඉහළ යාම.
(2) ආයෝජනය හා සේවා නියුක්තිය ඉහළ යාම.
(3) කර්මාන්ත වල අතිරික්ත ධාරිතාව අඩුවීම.
(4) ආයෝජන විශ්වාසනීයත්වය බිඳ වැටීම.
(5) භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම ඉහළ යාම.

20. දළ එකතු කළ අගය තුළ අන්තර්ගත වන්නේ,

(1) අතර මැදි යෙදවුම් වල අගයයි.
(2) මුළු නිමැවුමේ දළ අගයයි.
(3) ප්‍රාථමික ආදායම් වල අගයයි.
(4) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය හා ශුද්ධ ආනයන වල අගයයි.
(5) ප්‍රාථමික හා ද්විතීක ආදායම් වල අගයයි.

21. පහත සඳහන් කවර ප්‍රකාශයක් වැරදි ප්‍රතාශයක් වන්නේ ද?.

(1) දළ දේශීය වියදමට , විදේශ ශුද්ධ ප්‍රාථමික ගිණුමේ ශේෂය හා විදේශ ශුද්ධ ද්වීතීක ආදායම් ගිණුමෙ ශේෂය එකතු කිරීමෙන් වැයකළ හැකි ජාතික ආදායම ලැබේ.
(2) නිෂ්පාදකයාගේ මිලට හා වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය අතර වෙනස, ප්‍රවාහන වියදම්, වෙළෙඳ ආන්තික හා පාරිභෝගිකයා මත ශුද්ධ බදු වේ.
(3) දළ ජාතික ආදායමට වඩා වැය කළ හැකි ජාතික ආදායම ඉහළ අගයක් ගනු ලබන්නේ, විදේශ ශුද්ධ ද්විතීක ආදායම ධන අගයක් ගන්නා බැවිනි.
(4) කිසියම් වර්ෂයක පෞද්ගලික ආදායම, ජාතික ආදායම ඉක්ම වනු ලබන්නේ, , සංක්‍රාම ගෙවීම් වල මුළු ප්‍රමාණය, සමාජ ආරක්ෂක දායක මුදල්, සමාගමික ආදායම් බදු, සහ නොබෙදූ සමාගමික ලාභ වල එකතුව ඉක්මවා ඇති බැවිනි.
(5) සුදු කෙළියෙන් ලැබෙන ඉපැයීම් ජාතික ගිණුම්කරනයේ දී නිෂ්පාදන ඉමට ඇතුළත් නොවේ.

PAST PAPERS WIKI

22. කල්පිත ආර්ථිකයක් සම්බන්ධ පහත දත්ත ඔබට සපයා ඇත. (රු.බිලියන වලිනි.)

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයෝජනය | ( I ) | = 120 | රජයේ බදු | ( T ) | = 60 |
| ඉතුරුම් | (S ) | = 80 | රාජ්‍ය සහනාධාර | (Tr) | = 20 |
| ශුද්ධ අපනයන | ( X – M ) | = -50 | ස්වාධීන පෞද්ගලික පරිභෝජනය © | | = 100 |

ආන්තික පරිභෝජන නැමියාව ( MPC) = 0.75Yd

මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම හා රජයේ පරිභෝජන වියදම පිළිවෙලින්,

(1) 840 හා 70 කි. (2) 760 හා 50 කි.
(3) 740 හා - 30 කි. (4) 780 හා 70 කි.
(5) 840 හා 50 කි.

23. ආන්තික ඉතුරුම් නැමියාව ( MPS) 0.1 වන සංවෘත ආර්ථිකයක පවතින්නේ ස්වාධීන බදු පමණි. මෙම ආර්ථිකයේ රජයේ වියදම් රු. මිලියන 1200 ක් වැඩි කරනු ලැබුවේ රජයේ බදුද 500 කින් වැඩි කරමිනි. මේ අනුව මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුමට වන බලපෑම වන්නේ,

(1) 750 කින් වැඩි වේ. (2) 4500 කින් අඩු වේ. (3) 6800 කින් වැඩි වේ.
(4) 7500 කින් වැඩි වේ. (5) 12000 කින් වැඩි වේ.

24. ආන්තික පරිභෝජන නැමියාව 75 % ක් වූ ආර්ථිකයක , රජය සියළු ආදායම් මත 20% ක ස්ථාවර බදු අය කරනු ලබයි. මෙම ආර්ථිකයේ දළ ජාතික ආදායම 500 කින් ඉහළ යන්නේ නම්, පරිභෝජනය ආරම්භක වශයෙන් වැඩි වනුයේ,

(1) 100 කිනි. (2) 300 කිනි. (2) 375 කිනි.
(4) 740 කි. (5) 2000 කිනි.

25. කිසියම් ආර්ථිකයක දළ දේශිය නිෂ්පාදිතය පැවතියේ රු. බි. 3500 මට්ටමෙහිය නමුත්, පූරණ සේවා නියුක්ති මට්ටම වන රු. බි. 5000 තත්වයට මෙම ආර්ථිකය පැමිණියේ රජයේ වියදම් 600 කින් වැඩි වූ බැවිනි. මෙම දත්ත වලට අනුව ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැමියාව හා රාජ්‍ය වියදම් ගුණකයේ අගය වන්නේ,

(1) 0. 4 හා 6 කි (2) 6 හා 0.4 කි.
(3)0.6 හා 2. 5 කි (4) 0.75 හා 4 කි. (5) 0.8 හා 5 කි.

26. යම් කාලපරිච්ඡේදයක් තුළ ආර්ථිකයක මහජනයා සතු මුළු බැංකු තැන්පතු රු.බි. 1200 ක් වේ. මුළු මුදල් තොගය රු.බි. 1680 කි. මහ ජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය වන්නේ,

(1)360 (2) 480 (3)800 (4)1800 (5) 1920

27. ද්‍රවශීලතාවරණය යන්නෙන් අදහස් වනුයේ,

(1) වාණිජ බැංකු විසින් ද්‍රවශීල වත්කම් වල ආයෝජනය කිරීමයි.
(2) යම් වත්කමක් ප්‍රාග්ධන පාඩුවකින් සහ කාල පමාවකින් තොරව විනිමය මාධ්‍යයක් බවට පත් කර ගැනීමට පවතින හැකියාවයි.
(3) මහ බැංකුව ආර්ථිකය තුළ මුදල් සැපයුම ඉහළ නැංවීමයි.
(4) මහජනතාව මුදල්ශේෂ වශයෙන් සන්තකයේ තබා ගැනීමට දක්වන රුචිකත්වයයි.
(5) රජය බැංකු අංශයෙන් ණය ලබාගැනීමයි.

28. ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශකයක් වන , ජාතික පාරිභෝගික මිල දර්ශකය (2021= 100) යන දර්ශකයෙහි මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස ආහාර හා ආහාර නොවන බාණ්ඩයේ බරතැබීම් නිවැරදිව දැක්වෙන්නේ,

| | ජාතික පාරිභෝගික මිල ද¾ශකය | |
|---|---|---|
| | ආහාර | ආහාර නොවන |
| (i) | 39.22 | 60.78 |
| (ii) | 26.73 | 73.77 |
| (iii) | 44.04 | 55.96 |
| (iv) | 60.78 | 39.22 |
| (v) | 40.80 | 59.20 |

29. 2024 වර්ෂයෙහි මුදල් සමස්ත හා සම්බන්ධ ප්‍රවණතා සැලකා බැලීමේ දී වැරදි ප්‍රකාශය වනුයේ,

(1) පටු මුදල් සැපයුම ($M_1$) පහළ ගියේය.

(2) පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) සහ ($M_4$) වර්ධනය විය.

(3) පුළුල් මුදල් සැපයුම ($M_4$) ඉහළ යන ලදි.

(4) පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) වර්ධනයට මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාම හේතු විය.

(5) මුදල් ගුණකය ($M_{2b}$) අඩු විය.

30. මුදල් සැපයුම ($M_{2b}$) බිලියන 500 ක් වන ආර්ථිකයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 400 ක් සහ මුදල් සංසරණ ප්‍රවේගය 4 ක අගයක් ගනී. මුදල් ප්‍රමාණවාදී න්‍යායේ උපකල්පන අනුව මුදල් සැපයුම 10 % න් ඉහළ ගිය හොත් දළ දේශීය නිෂ්පාදිතයේ නාමික අගය කොපමණ ද ?

(1) 440 (2) 550 (3) 800 (4) 20000 (5) 2200

31. කිසියම් පුද්ගලයෙක් සපත්තු නිෂ්පාදනය කරන අතර එම කර්මාන්තය නිසා එයට සම්බන්ධයක් නැති බාහිර පුද්ගලයන්ට ලැබෙන ප්‍රතිලාභයන්ට වඩා දැරීමට සිදුවන වියදම වැඩි අගයක් ගනී. මේ නිසා වෙළෙඳ පොලේ

(1) අධි නිෂ්පානයක් බිහි වේ.

(2) ඌණ නිෂ්පාදනයක් බිහි වේ.

(3) වෙළෙඳ පොළ නිමැවුම හා ප්‍රශස්ත නිමැවුම සමාන වේ.

(4) සමතුලිත මිලට බලපෑමක් සිදු නොවේ.

(5) සමතුලිත මිලට වඩා ප්‍රශස්ත මිල අඩු වේ.

.

32. 2024 වර්ෂය සඳහා රාජ්‍ය අයභාරයට බදු මගින් හා බදු නොවන මාර්ග තුළින් ලබා දුන් දායකත්වය පිළිවෙලින් ,

(1) 9.9 , 1.2 (2) 89. 2 . 10. 8 (3) 91. 9 , 8.1

(4) 88. 4 , 11. 6 (5). 89.0 , 11 .0

33. පුනරාවර්තන වියදමින් හරි අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් වර්තමානයේ වැය වන අංශය වන්නේ,

(1) රාජ්‍ය සේවක වැටුප් ගෙවීමටය. (2).අස්වැසුම සහනාධාර ලබා දීමටය.
(3) පොහොර සහනාධාරය දීමටය. (4) රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීමටය.
(5) පාසැල් ළමුන්ට නොමිලයේ ලබා දෙන නිල ඇඳුම් හා පෙළ පොත් ලබාදීමටය.

34. අභිනව වර්ෂය සඳහා ආණ්ඩුව විසින් සිදු කිරීමට අපේක්ෂිත ආදායම ,වියදම හා ණය ගැනීම වැනි කාර්යයන් සඳහා පාර්ලිමේන්තුවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලියවිල්ල වන්නේ,

(1).අතුරු සම්මත ගිණුම (2). අයවැය ලේඛණය
(3) පරිපූරක වැය ඇස්තමේන්තුව . (4) අයවැය විසර්ජන කෙටුම්පත.
(5) විසර්ජන පනත.

35. එක්තරා වර්ෂයක පොලී ගෙවීම් රහිත රජයේ මුළු පුනරාවර්තන වියදමේ හා ප්‍රාග්ධන වියදමේ එකතුව විදේශ ප්‍රදාන ලැබීම් ඇතුළත් මුළු රාජ්‍ය අයභාරයට වඩා වැඩිනම්,

(1) අයවැය අතිරික්තයක් බිහි වේ. (2). අයවැය හිගයකි.
(3)ප්‍රාථමික ගිණුමේ හිගයක් පෙන්නුම් කරයි. (4) වර්තන ගිණුමේ අතිරික්තයකි.
(5) ශුද්ධ මූල්‍ය හිඟය ශුන්‍යයි.

36. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී සාපේක්ෂ වාසි න්‍යාය යනු,

(1) කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් එක් රටකට සාපේක්ෂව අඩු පිරිවැයකින් තවත් රටක් එම භාණ්ඩය නිෂ්පාදනය කිරීමයි.
(2) තම රටේ නිපදවනවාටත් වඩා අඩු පිරිවැය සහිත මිලක් යටතේ අනෙක් රටේ වෙළෙඳ පොලට භාණ්ඩ අපනයනය කිරීමයි.
(3) තම රටේ නිපදවනවාට වඩා නිරපේක්ෂව අඩු පිරිවැයක් යටතෙ භාණ්ඩ නිෂ්පාදනය කොට දෙරට අතර හුවමාරු කර ගැනමයි.
(4) එක් රටක නිපදවනවාට වඩා අඩු පිරිවැයක් මත කාර්යක්ෂම භාණ්ඩ විශේෂීකරනය කොට හුවමාරු කර ගැනීමයි.
(5) එක් එක් රට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයක් යටතේ පවතින භාණ්ඩය විශේෂීකරණය කොට හුවමාරු කර ගැනීමයි.

37. තීරු බදු රහිත ආනයනික විදුලි බල්බයක මිල රු. 800 ක් වන අතර, මේ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කොට රට තුළ නිපද වන්නේ නම්, බල්බයක් සඳහා තීරු බදු රහිත ආනයනික අමුද්‍රව්‍ය මිල රු. 500 කි. රජය විසින් ආනයනික නිමි භාණ්ඩ මත 50% ක බද්දක් ද , අමුද්‍රව්‍ය මත 20% ක බද්දක්ද අයකරනු ලබන්නේ නම්, සඵල ආරක්ෂක අනුපාතිකය වන්නේ ,

(1) 30 % කි. (2) 70 % (3)100%
(4) 133.3 කි. (5) 300 % කි.

38. ශ්‍රී ලංකාව 2025 ජනවාරි මස පළවෙනිදා සිට බලාත්මක කරන ලද නිදහස් වෙළෙඳ ගිවිසුම වන්නේ,

(1) ආසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම. (APTA)
(2) පකිස්ථාන ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුම. (PSFTA)
(3) සාර්ක් වරණීය වෙළෙඳ ගිවිසුම. (SAPTA)
(4) ඉන්දු ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුම. (ISFTA)
(5) තායිලන්ත ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම. (SLTFTA)

PAST PAPERS WIKI

39. ශ්‍රී ලංකා රජය විසින් ජපානයෙන් ලබා ගත් ණය මුදලකින් කොටසක් කපා හැරීමට ජපන් රජය විසින් තීරනය කරනු ලැබුවහොත් , එය ගෙවුම් ශේෂයේ සටහන් වන්නේ,
   (1) ප්‍රාග්ධන ගිණුමේ බැර ශේෂයක් වන අතර, මූල්‍ය ගිණුමෙහි අනෙකුත් ආයෝජන යටතේ ණය ශීර්ෂයට අදාළව හර ශේෂයක් වේ.
   (2) ප්‍රාග්ධන ගිණුමේ හර ශේෂයක් වන අතර, මූල්‍ය ගිණුමෙහි අනෙකුත් ආයෝජන යටතේ ණය ශීර්ෂයට අදාළව බැර ශේෂයක් වේ.
   (3) වර්තන ගිණුමේ බැර ශේෂයක් වන අතර, මූල්‍ය ගිණුමෙහි අනෙකුත් ආයෝජන යටතේ ණය ශීර්ෂයට අදාළව හර ශේෂයක් වේ.
   (4) මූල්‍ය ගිණුමේ ණය ශීර්ෂයට අදාළව හර ශේෂයක් වන අතර, මූල්‍ය ගිණුමෙහි අනෙකුත් ආයෝජන යටතේ බැර ශේෂයක් වේ.
   (5) එම තත්වය ජංගම ගිණුමට හෝ ප්‍රාග්ධන ගිණුමට අදාළ නොවන අතර මූල්‍ය ගිණුමෙහි පමණක් කපා හැරී ණය ප්‍රමාණය බැර ශේෂයක් ලෙස සටහන් වේ.

40. කිසියම් භාණ්ඩ පැසක් ලංකාවේ දී මිල දී ගැනීමට රු. 18000 ක් වැය වන අතර , එම භාණ්ඩ පැසම ඇමරිකාවේ දී මිල දී ගැනීමට ඇමරිකානු ඩොලර් 80 ක් වැය වෙ නම්, ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය වන්නේ, ඩොලර් 1 = රුපියල්
   (1) 44 කි. (2) 440 කි. (3) 225 කි. (4) 300 කි. (4) 2250 කි.

41. පාවෙන විනිමය අනුපාතිකය යනු,
   (1) රාජ්‍ය පාලකයින්ට රිසි සේ විනිමය අනුපාතිකය තීරනය කිරීමට හැකි තත්ත්වයකි.
   (2) රටක ව්‍යවහාර මුදල් නිකුත් කොට මුදලේ අගය තීරනය වූ පසු විදේශ වෙලෙදාමට උචිත ලෙස යොදා ගැනීමයි.
   (3) ආනයන , අපනයන, හා විදේශ ණය, මත විදේශ මුදලේ දේශීය අගය තීරණය වීමයි.
   (4) නිදහස් වෙළෙඳ ගිවිසුම්, වලට අනුකූලව දේශීය මුදලේ විදේශීය අගය තීරණය වීමට ඉඩ දීමයි.
   (5) ජාත්‍යන්තර ගණුදෙනු වලදී කිසියම් රටක ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත තීරණය වන විනිමය අනුපාතයයි.

42. අපනයන මිල දර්ශකය , ආනයන මිල දර්ශකයෙන් බෙදා සියයෙන් වැඩි කිරීමෙන් ලැබෙනුයේ,
   (1) භාන්ඩ වෙළෙඳ අනුපාතයයි.
   (2) ආදායම් වෙළෙඳ අනුපාතයයි.
   (3) බහු විධ විනිමය අනුපාතයයි.
   (4) සඵල විනිමය අනුපාතිකයයි.
   (5) මූර්ත සඵල විනිය අනුපාතිකයයි.

43. ආර්ථික වර්ධනයට වඩා පුළුල් සංකල්පයක් ලෙස සංවර්ධනය යන්නෙන් අදහස් කරනුයේ,
   (1) ආර්ථික සමාජයීය හා පාරිසරික යන පැති කඩ තුනෙහි සමබර වර්ධනයයි.
   (2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයයි.
   (3) මූර්ත නිමැවුම ඉහළ යෑමත් සමග ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් සිදු වීමයි.
   (4) ආර්ථික වෘද්ධියත් සමගඇති වන්නා වූ මිනිස් ජීවිත වල ගුණාත්මක වර්ධනයයි.
   (5) ආර්ථික උත්පාත හා අවපාත වලින් තොරව ආර්ථිකය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමයි.

44. 2019 සමාජ ආර්ථික සමීක්ෂණය දත්ත අනුව ඉහළම දරිද්‍රතා දර්ශක අගය පෙන්නුම් කරන පළාත හා දිස්ත්‍රික්කය පිළිවෙලින් ,

(1) ඌව පළාත හා මුලතිව් දිස්ත්‍රික්කයයි.

(2) සබරගමු පළාත හා මුලතිව් දිස්ත්‍රික්කයයි.

(3) නැගෙනහිර පළාත හා කිලිනොච්චි දිස්ත්‍රික්කයයි.

(4) උතුරු පළාත හා කිළි නොච්චි දිස්ත්‍රික්කයයි.

(5) ඌව පළාත හා කිලිනොච්චි දිස්ත්‍රික්කයයි.

45. කිසියම් රටක ප්‍රජාවිද්‍යාත්මක දත්ත කීපයක් පහත පරිදි වෙයි.(මිලියන වලිනි)

| | |
|---|---|
| - සේවා නියුක්ත ජනගහනය | 324 |
| - ආර්ථිකමය වශයෙන් අක්‍රීය ජනගහනය | 240 |
| - මුළු ජනගහනය | 720 |
| - අවුරුදු 15 සහ ඊට වැඩි වැඩ නළ හැකි වයසේ ජනගහනය | 600 |
| - සේවා වියුක්ත ජනගහනය | 56 |

ඉහත දත්ත අනුව මෙම රටේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය හා සේවා වියුක්ත අනුපාතිකය දැක්වෙන පිළිතුර වනුයේ,

| | ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය | සේවා වියුක්ති අනුපාතිකය |
|---|---|---|
| (1) | 33.3% | 5.6% |
| (2) | 60.0% | 10.0% |
| (3) | 50.0% | 6.6% |
| (4) | 53.6% | 10.0% |
| (5) | 50.0% | 5.5% |

46. 2023 දත්ත මත ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය හා ශ්‍රී ලංකාවේ ස්ථානය (2023 දත්ත පදනම් කරග 2025 බැංකු වාර්තාව අනුව) පිළිවෙලින්,

(1) 0.782 සහ 73 වන ස්ථානයයි.

(2) 0.780 සහ 73 වන ස්ථානයයි.

(3) 0.776 සහ 89 වන ස්ථානයයි.

(4) 0.782 සහ 78 වන ස්ථානයයි.

(5) 0.747 සහ 90 වන ස්ථානයයි.

47. සමාජයේ කුටුම්බ අතර ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය හදුනා ගැනීමේ දී පහත ප්‍රකාශ වලින් **නිවැරදි** ප්‍රකාශය වනුයේ කුමක් ද? .

(1) ලෝරන්ස් වක්‍රය සම ව්‍යාප්ති රේඛාව මත පිහිටයි නම්, ගිනි සංගුනකයේ අගය 1 වේ.

(2) ලෝරන්ස් වක්‍රය දකුණු පස තිරස් හා සිරස් ලක්ෂයම මත පිහිටයි නම්, ගිනි සංගුණකය ශූන්‍ය වෙයි.

(3) ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාවෙන් දුරස් වන තරමට ආදායම් බෙදී යාමේ විෂමතාවය අඩු වෙයි.

(4) ලෝරන්ස් වක්‍රය ගිනි සංගුනණකය මතම පිහිටයි නම් , ගිනි සංගුණකය ශූන්‍ය වේ.

(5) ගිනි සංගුනකය 1 ට ආසන්න වන තරමට ආදායම් බෙදී යාමේ විෂමතාවය අඩුය.

48. 2024 වර්ෂයේ ජන හා නිවාස සංගණන වාර්තාව අනුව, ශ්‍රී ලංකාවේ ජන ඝණත්වය (වර්ග කිලෝ මීටරයකට පුද්ගලයන් සංඛ්‍යාව ) හා , වැඩිම ජන ඝනත්වය පිළිබිඹු කරන දිස්ත්‍රික්කටය පිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය කුමක් ද?

(1) 352 සහ ගම්පහ , කොළඹ, මහනුවර.

(2) 349 සහ කළුතර, කොළඹ , මහනුවර.

(3) 352 සහ කොළඹ , ගම්පහ , කළුතර

(4) 352 සහ මුලතිව්, මන්නාරම , වවුනියාව

(5) 349 සහ ගම්පහ , කළුතර, කොළඹ

49. 2024 වර්සයේ (මහ බැංකු වාර්තාවට අනුව) සේවා අංශයෙන් දළ දේශිය නිස්පාදිතයට හා සේවා නියුක්තියට දායකත්වය පිළිවෙලින් දැක්වෙන්නේ,

| | දළ දේශිය නිෂ්පාදිතය. | සේවා නියුක්තිය |
|---|---|---|
| (1) | 60 . 7 % | 47. 5% |
| (2) | 58 . 7 % | 46. 5% |
| (3) | 59. 2 % | 48. 7% |
| (4) | 56 . 5 % | 25. 5% |
| (5) | 59 . 2 % | 45. 5% |

50. ද්වි පාර්ශවික ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිල ණය හිමියන්ගේ කමිටුව (OCC) සහ චීනයේ EXIM බැංකුව සමග සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ලබා දුන් ණය සහනයක් නොවන්නේ කුමක් ද?

(1) පොලී අනුපාතිකය 2% සහන අනුපාතිකයකට පත් කිරීම.

(2) ණය ආපසු ගෙවීමට 2028 වසර දක්වා සහන කාලයක් ලබා දීම.

(3) ණය ආපසු ගෙවා නිම කරන කාලය 2028 සිට 2043 වසර දක්වා කාලයක් ලබා දීම.

(4) ස්වෛරීත්ව බැඳුම් කර යටතේ ලබාගත් ණය වලින් 28% ක් කපා හැරීම.

(5) ණය වල මුහුණත වටිනාකම අඩු කිරීමක් හෙවත් ණය කපා හැරීමක් (Hair cut) සිදු කිරීම.

☸☸☸

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

**13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026**
**தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026 / Grade 13 Final Term Test - 2026**

| ආර්ථික විද්‍යාව - 11 | 21 | S | 11 | කාලය / நேரம் / Time } පැය 3 යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name } ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..........................

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්:**
* "අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## "අ" උප කොටස

(1) (i) ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ විය හැකිද? උදාහරන සහිතව පැහැදිලි කරන්න. (ලකුනු 04යි.)

(ii) සාධක ඵලදායීතාවය යනු කුමක් ද? ඵලදායීතාවය තීරනය කරන සාධක කවරේ ද? (ල.4යි)

(iii) ආවස්ථික පිරිවැය යනු කුමක් ද? එය ශූන්‍ය විය හැකි අවස්ථා දක්වන්න. (ලකුනු 04යි.)

(iv) මිශ්‍ර ආර්ථිකයක පවතින ලක්ෂණ නම්කර පාරිභෝගික ස්වාධිපත්‍ය එහි ක්‍රියාත්මක වන ආකාරය පැහැදිළි කරන්න. (ලකුනු 04යි.)

(v) රටක නිෂ්පාදන ධාරිතාවය වෙනස් වීමට බලපාන කරුනු නම් කර පහත සඳහන් දෑ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් පෙන්නුම් කරන්න.

(අ) 10% ක ආර්ථික වෘද්ධියක්

(ආ) ඛනිජ තෙල් සැපයුම අඩාල වීම නිසා භාණ්ඩ නිෂ්පාදනය කෙටිකාලයක් තුළ අඩාලවීම.

(ඉ) රටතුළ ඉඩෝරයක් පැවතීම.

(ඊ) රටක් ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වී හුවමාරුවේ වාසි ලබා ගැනීම. (ලකුනු1x4යි)

(2) **(අ)** (i) සාමාන්‍ය භාණ්ඩයක මිල වැඩි වීමක දී , ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමට බලපාන ප්‍රතිවිපාක දෙක පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

(ii) එක්තරා භාන්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහතින් දැක්වේ.

$Qd = 16 - p$ (ඉල්ලුම් සමීකරණය )

$Qs = -4 + p$ (සැපයුම් සමීකරණය )

ඒකකයක රුපියල් මිල P වලින් දැක්වෙන අතර ඒකක ප්‍රමාණය දහස් වලින් Q වලින් දැක්වේ.

(a) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුනු 02යි.)

(b) සමතුලිතයේ දී අයභාරය ගණනය කරන්න. (ලකුනු 02 යි.)

PAST PAPERS WIKI

**(ආ)** තරඟකාරී වෙළෙඳ පොළක කිසියම් භාන්ඩයක වෙළෙඳ පොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සරල රේඛීය වේ. එම භාන්ඩයේ පහත තොරතුරු ඔබට දී ඇත.

| මිල රුපියල් | අධි ඉල්ලුම් ප්‍රමාණය | ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| 20 | 400 | 500 |
| 100 | -400 | 100 |

(i) ඉල්ලුම් සැපයුම් සමීකරණ ගොඩ නගා සමතුලිත මිල හා ප්‍රමාණයන් ගණනය කොට එය ප්‍රස්ථාර ගත කිරීමෙන් තහවරු කරන්න. (ලකුනු 04 යි.)

(ii) සමතුලිත මිලේ දී ආර්ථික අතිරික්තය ගණන් බලන්න. (ලකුනු 03 යි.)

(iii) තරඟකාරී වෙළෙඳ පොළ සමතුලිත නිමැවුමේ දී සම්පත් භාවිතය කාර්යක්ෂමව සිදුවන බවට, දැක්විය හැකි කොන්දේසි දෙකක් දක්වන්න. ( ලකුනු 02 යි.)

(iv) භාණ්ඩයක සැපයුම් නම්‍යතාවය නම්‍ය වීමට බලපෑ හැකි හේතු තුනක් දක්වන්න. (ලකුනු 03යි.)

(3) (i) කෘෂි භාණ්ඩ වල මිල උච්චාවචනයට බලපාන සාධක මොනවා ද ? (ලකුණු 04යි.)

(ii) නිෂ්පාදන සළාක නියම කිරීම මගින් කෘෂි භාණ්ඩ වල මිල ස්ථායීකරණය සිදුවන ආකාරය රූප සටහන් ආශ්‍රය කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

(iii) කිසියම් භාණ්ඩයකට නිෂ්පාදන සහනාධාරයක් ලබා දීම හේතුවෙන් වෙළෙඳපොළ මිලට කිසිඳු බලපෑමක් සිදු නොවන අවස්ථාවන් කවරේ ද?එවැනි අවස්ථාවක සහනාධාරයේ වාසිය කවුරුන් විසින් අත්පත් කරගන්නේ ද යන්න රූපසටහනක් ආධාරයෙන් පෙන්වන්න. (ලකුණු 04යි)

(iv)කිසියම් භාණ්ඩයකට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 200 - 5P$ $Qs = -20 + 5P$

මෙම භාණ්ඩය මත රජය විසින් රු. 12/= ක උපරිම මිලක් පැනවීමට රජය තීරණය කරයි.

(අ ) උපරිම මිල නියම කළ පසු කළු කඩ මිලක් තීරණය වී ඇත්නම්, එවන් තත්ත්වයක් යටතේ පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයට වන බලපෑම ගණණය කරන්න.(ලකුණු 04 යි.)

(ආ) අධි සැපයුම හෝ අධි ඉල්ලුම කොපමණ ද? (ලකුණු 02 යි.)

(ඇ) වෙළෙඳ පොළ භාණ්ඩ හිගය ඉවත් කිරීම සඳහා රජයට ගත හැකි ක්‍රියා මාර්ග දක්වන්න. (ලකුණු 02 යි.)

(4) (i) යෙදවුම්, නිෂ්පාදිතය හා නිෂ්පාදනය යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී යෙදවුම් වැඩි කරමින් භාන්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ දී මුළු ඵලදාව , සාමාන්‍ය ඵලදාව , හා ආන්තික ඵලදාවේ හැසිරීම ජ්‍යාමිතිකව නිරූපනය කරමින් පැහැදිලි කරන්න. (ලකුනු 04යි.)

(iii) පූර්ණ තරගකාරී ආයතනයක ආර්ථික ලාභ ශුන්‍ය වීම, අවාසි දායක තත්ත්වයක් ද? ඔබ ආයතනයේ ව්‍යවසායකයා යැයි සිතා මෙම අවස්ථාව ආර්ථික විද්‍යාත්මකව පැහැදිලි කරන්න. (ලකුනු 04 යි.)

(iv) පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමානානුකූල නොපිරිමැසුම් ඇතිවීමට බලපාන හේතු 2 බැගින් ලියන්න. (ලකුනු 04 යි.)

(v) කිසියම් නිෂ්පාදන ආයතනයක් සම්බන්ධව එක් මසක තොරතුරු පහත දැක්වේ. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| පරිපාලන වියදම් | 20000 |
| වැටුප් ගෙවීම් | 16000 |
| ප්‍රාමාණික ලාභය | 24000 |
| අමුද්‍රව්‍ය වියදම් | 42000 |
| පොලී ගෙවීම් | 22000 |
| ඉන්ධන සඳහා වියදම් | 8000 |
| බදු කුලිය | 18000 |
| භාණ්ඩ ඒකකයක මිල | 800 |
| නිෂ්පාදන ඒකක ප්‍රමාණය | 250 |

(අ) මුළු විචල්‍ය පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය (ලකුනු 02 යි.)

(ආ) මුළු අයභාරය හා මුළු පිරිවැය (ලකුනු 02 යි.)

(ඇ) ආර්ථික ලාභය හෝ අලාභය (ලකුනු 01 යි.)

(5)(i) ආර්ථික පසු බැසීම (ප්‍රතිගමනය) හා ප්‍රසාරණය යන්න ව්‍යාපාර චක්‍ර මගින් පැහිදිළි කරන්න. (ලකුනු 04 යි.)

(ii) වියදම් ප්‍රවේශය මගින් ජාතික ගිණුම් තැබීමේ දී ඇතුළත් නොකරන වියදම් වර්ග කවරේ ද?
. (ලකුණු 03 යි.)

(ii) කල්පිත ආර්ථිකයක් සම්බන්ධ පහත තොරතුරු ඔබට සපයා ඇති අතර, සියළු දත්ත රු. බිලියන වලිනි.

| | |
|---|---|
| දළ දේශීය වියදම | 1850 |
| පෞද්ගලික පරිභෝජනය | 900 |
| රජයේ පරිභෝජනය | 600 |
| ශුද්ධ අපනයන | -100 |
| අපනයන | 300 |
| විදේශ ගිණුම් වල වර්තන ගිණුමේ ශේෂය | -150 |

(අ) දළ ආයෝජනය (ලකුණු 01 යි.)

(ආ) දළ දේශිය නිෂ්පාදිතය (ලකුණු 01 යි.)

(ඉ) දේශීය හා ජාතික ඉතුරුම් (ලකුණු 02 යි.)

(ඊ) තුළිත ශේෂ සාම්‍යය (ලකුණු 02 යි.)

(iv)

| වැයකළ හැකි ආදායම (රු.) | පරිභෝජන වියදම රු. |
|---|---|
| 0 | 500 |
| 5000 | 4500 |
| 10000 | 8500 |
| 15000 | 12500 |
| 20000 | 16500 |
| 25000 | 20500 |

(අ) මීට අදාළ පරිභෝජන ශ්‍රිතය ගොඩ නගන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ ආයෝජනය රු. 820 ක් ද රජයේ වියදම් 500 ක් ද රජයේ ආදායම් බදු 120 ද ශුද්ධ අපනයන - 24 ද වේ නම්, සමතුලිත නිමැවුම සොයන්න. (ල. 03 යි)

(ඇ)ආදායම 25000 දී සාමාන්‍ය පරිභෝජන නැඹියාව හා සාමාන්‍ය ඉතුරුම් නැඹියාව සොයන්න. (ලකුණු 02යි.)

## “ආ” උප කොටස

(6) (i) සැපයුමෙන් තල්ලු වූ උද්ධමනය (පිරිවැයෙන් තල්ලු වූ) රූපසටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි.)

(ii) මහජනයා විසින් මුදල් ඉල්ලුම් කරනු ලබන්නේ ඇයි? ඒ සඳහා බලපාන සාධක කවරේ ද? (ලකුණු 04 යි.)

(iii) බැංකු පද්ධතියක් තුළ ඇති එක්තරා වානිජ බැංකුවක් සතුව රු. මි. 1500 ක තැන්පතුවක් පවතී. රු. මි. 1000 ක ප්‍රාග්ධන වත්කම් ඇත. රු. මි. 400 ක සංචිත පවතින මෙම බැංකුව රු. මි. 1100 ක ණය නිකුත් කොට ඇත. තව ද රු. මි. 1000 ක සුරැකුම්පත් ද පවතී.

(අ) මෙම බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය දක්වන්න. (ලකුණු 02යි.)

(ආ) මෙම වානිජ බැංකුව සතුව අධි සංචිත ලෙස රු. මි. 100 ක් පවතී නම්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කරන්න. (ලකුණු 02 යි.)

(ඉ) මෙම වානිජ බැංකුවට රු. මි. 500 ක නව තැන්පතුවක් ලැබුණ පසු බැංකු පද්ධතියට ලබා දිය හැකි නව උපරිම ණය ප්‍රමාණය දක්වන්න. (ලකුණු 02 යි.)

(iv) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව තම මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමානයේ භාවිතා කරනු ලබන ප්‍රධාන උපකරණ මොනවා ද? (ලකුණු 03 යි)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොළී අනුපාතිකයක ක්‍රම වේදය සිට තනි ප්‍රතිපත්ති පොළී අනුපාතික ක්‍රම වේදයකට මාරු වීමේ ප්‍රතිලාභ කවරේ ද? (ලකුණු 03 යි.)

(ඉ) බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය යනු කුමක් ද? එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන මුදල් ප්‍රතිපත්ති රාමුව සමග සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 02යි.)

.

7. (i) සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ පැහැදිළි කර , වෙළෙඳ පොළ ආර්ථිකයක් මෙය නොසැළකීම නිසා වෙළෙඳ පොළ අසමත් වන ආකාරය පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

(ii) “සාධාරණ බව ”යන බදු මූලධර්මය පැහැදිළි කර එහි ප්‍රභේද නම් කරන්න. (ලකුනු 04 යි.)

(iii) අතුරු අයවැය ලේඛණය, හා අතුරු සම්මත ගිණුම පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

(iv) සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්තිය යනු කුමක් ද? නිදසුන් යොදා ගනිමින් පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

(v) පෞද්ගලීකරණය යනු කුමක් ද? එමගින් ලබා ගත හැකි හිතකර තත්ත්වයන් මොනවා ද? (ලකුනු 04 යි)

8. (i) රටවල් දෙකක් සම්බන්ධව පැන් හා පැන්සල් නිෂ්පාදනයට එක් ඒකකයක් සම්බන්ධයෙන් වැයවන ශ්‍රම පැය ගණන පහත දැක්වේ.

| භාණ්ඩ වර්ගය | A රට | B රට |
|---|---|---|
| පැන් | 4 | 2 |
| පැන්සල් | 12 | 10 |

(අ) භාණ්ඩ දෙක නිෂ්පාදනය සම්බන්ධයෙන් කාර්යක්ෂම රට කුමක් ද? (ලකුණු 2 යි.)

(ආ) එක් එක් රට සාපේක්ෂ වාසි අත්පත් කර ගන්නේ කෙසේ ද? (ලකුණු 2 යි.)

(ඉ) එක් එක් රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාත සහ රටවල් දෙකටම වාසි සහගත ජාත්‍යන්තර හුවමාරු අනුපාත පරාසය පෙන්වන්න. (ලකුණු 2 යි.)

(ii) අන්තර්ජාතික වෙළෙඳාමේ සඵලතාවය විමසන්න . (ලකුණු 4 යි.)

(iii)ආර්ථිකයක ගෙවුම් ශේෂයේ වර්තන ගිණුම තුළ පවතින, සේවා ගිණුම තුල ඇතුළත් වන ප්‍රධාන ගණුදෙනු හතරක් ලියන්න. (ලකුණු 2 යි.)

(iv)ගෙවුම් ශේෂයේ සමස්ත ගිණුමේ හිගයක් දිගු කාලීනව පවතීනම්,ආර්ථිකයේ සිදු කළ යුතු ක්‍රියා මාර්ග හතරක් ලියන්න. (ලකුණු 2 යි.)

(v)විනිමය අනුපාතිකය උච්ඡාවචනය වීමට බලපාන සාධක හතරක් ලියන්න. (ලකුණු 2 යි.)

(vi) ශ්‍රී ලංකාවට ඇමරිකානු සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යාම ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතය තීරණය වීමට බලපාන ආකාරය වක්‍ර කියවීම යටතේ රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4 යි.)

9. (අ)(i) ආර්ථික වෘද්ධිය (වර්ධනය) උපනතියකි.කෙටියෙන්අර්ථ දක්වන්න. (ලකුණු 03 යි.)

(ii) සංවර්ධනය ආර්ථික සංවර්ධනයටත් වඩා පුළුල් සංකල්පයකි.පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii)නිරපේක්ෂ දරිද්‍රතාවය යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද? එම පදනම මත රටක දිළිඳු ජනගහනයේ ප්‍රමාණය මණිනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 03 යි)

(ආ)(i)කුටුම්භ අතර ආදායම් ව්‍යාප්තිය හා පංචමක අපකිරණ අනුපාතිකය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) ව්‍යුහමය සේවා වියුක්තිය යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද? (ලකුණු 02 යි.)

(iii)ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීමේ අහිතකර ප්‍රතිවිපාක තවරේ ද? (ලකුණු 04 යි.)

10. (i) ගෝලීය තරඟකාරිත්වය පිළිබඳ දර්ශකය, ගණනයට අදාළ ප්‍රධාන නිර්ණායකයන්ට පොදු ප්‍රධාන කරුණු කවරේ ද?

(ii) ගෝලීය ආර්ථික සංසදයේ නවතම වාර්තාව අනුව ඉදිරිපත් කරන **නව ආර්ථිකය ((New Economy)** යන සංකල්පයෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iii)සමාජ ආරක්ෂනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැයි දක්වා ශ්‍රී ලංකාවේ දැනට දැක ගත හැකි සමාජ ආරක්ෂණ වැඩ සටහන් තුනක් ලියන්න.

(iv) වර්තමාන ශ්‍රී ලංකා රාජ්‍යයේ ආර්ථික ප්‍රතිපත්තියේ ඉටු කර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන ස්ථම්භ තුන කවරේ ද?

(v) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටළු පවතින බව නිතර අසන්නට ලැබෙයි.එසේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පවත්නා ගැටළු කවරේ ද?

(ලකුණු 4 x 5 යි)

☸☸☸

.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026 / Grade 13 Final Term Test - 2026

2026 පිළිතුරු පත්‍රය | 21 | S | 11 | කාලය / நேரம் / Time පැය 3 යි

නම / பெயர் / Name ............ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ............

## “අ” උප කොටස

**(i) ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ විය හැකිද? උදාහරන සහිතව පැහැදිලි කරන්න.** (ලකුනු 04යි.)

ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ විය හැකිය. ආරෝථික නොවන භාණ්ඩයක, මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව හිගකමක් ඇති වුවහොත් හෝ එය ආවස්ථික පිරිවැයක්, සම්පත් පිරිවැයක් දරා ලබා ගැනීමට සිදුවුවහොත් , එවිට ආර්ථික නොවන භාණ්ඩ ද ආර්ථික භාණ්ඩ වේ (ලකුනු 02යි.)

කිමිදුම් කරුවෙකුට ඔක්සිජන් වාතය හිග සම්පතකි. ඒ නිසා ඔහුට සම්පත් පිරිවැයක් හෝ ආවස්ථික පිරිවැයක් දරා ලබා ගැනීමට සිදු වේ. (ලකුනු 02යි.)

(ගැලෙපන ඕනෑම උදාහරණයකට ලකුණු දෙන්න)

**(ii) සාධක ඵලදායීතාවය යනු කුමක් ද? ඵලදායීතාවය තීරනය කරන සාධක කවරේ ද? (ල.4යි)**

යෙදවුම් ඒකකයකින් ලබාගත හැකි නිමැවුම් ප්‍රමාණය ඵලදායීතාවයයි.
(ලකුනු 01යි.) එය ගණනය කරනු ලබන්නේ,

$$\text{ඵලදායීතාවය} = \frac{\text{නිමැවුම් ප්‍රමාණය}}{\text{යෙදවුම් ප්‍රමාණය}}$$

(ලකුනු 01යි.)

තීරණය කරන සාධක :-

- තාක්ෂණය
- කළමනාකරණය
- මානව ප්‍රාග්ධනය,
- ශ්‍රම විභජනය හා විශේෂීකරණය

(ඕනෑම කරුනු 02 කට ලකුනු 02 කි)

**(iii) ආවස්ථික පිරිවැය යනු කුමක් ද? එය ශුන්‍ය විය හැකි අවස්ථා දක්වන්න. (ලකුනු 04යි.)**

සම්පත් වල හිගකමක් හා විකල්ප අවස්ථාවන් පවතින විට, තෝරාගැනීමක් කිරීමට සිදුවන අතර, එම තෝරා ගැනීමේ දී කැපකරනු ලබන හොඳම විකල්පය ,තෝරා ගත් දේහි ආවස්ථික පිරිවැය වේ. (ලකුනු 02යි.)

- සේවා වියුක්ත සම්පත් සේවා නියුක්ත කරන විට.
- විකල්ප ප්‍රයෝජන නොමැති විට
- අසීමිත සැපයුමක් පවතින විට.(ආර්ථික නොවන භාන්ඩ)          (ලකුනු 02යි.

**(iv) මිශ්‍ර ආර්ථිකයක පවතින ලක්ෂණ නම්කර පාරිභෝගික ස්වාධිපත්‍ය එහි ක්‍රියාත්මක වන ආකාරය පැහැදිළි කරන්න.** **(ලකුනු 04යි.)**

- ➢ සම්පත් අයිතිය පෞද්ගලික හා රාජ්‍ය අංශය සතු වීම.
- ➢ පෞද්ගලික අංශය ලාභ පරමාර්තයෙන් හා රාජ්‍ය අංශය සමාජ සුභ සාධන පරමාර්තයෙන් ක්‍රියාත්මක වීම .
- ➢ ආර්ථිකය තුළප්‍රධාන ක්‍රියාකාරී අංශ වන්නේ, පාරිභෝගිකයන්, නිෂ්පාදකයන් හා රාජ්‍ය අංශය වීම.
- ➢ සම්පත් බෙදා වෙන් කිරීමේ තීරණ සැළසුම් යන්ත්‍රනයෙන් මෙන්ම, මිල ක්‍රමය මගින් ද සිදු කරයි.
- ➢ ආණ්ඩුව ආර්ථිකය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

( කරුණු 4ට ලකුණු 02 යි.)


පාරිභෝගිකයන් ඉල්ලුම් කරන භාණ්ඩ නිෂ්පාදකයින් විසින් නිෂ්පාදනය කිරීම පාරිභෝගික ස්වාධිපත්‍යයි. මෙය මිශ්‍ර ආර්ථිකයක පෞද්ගලික අංශය විසින් සිදු කරන අතර රජය පෞද්ගලික ඉල්ලුමට වඩා සමාජ අවශ්‍යතාවය මත නිෂ්පාදන කටයුතු වල නිරත වේ.          (ලකුනු 02යි.)

**(v) රටක නිෂ්පාදන ධාරිතාවය වෙනස් වීමට බලපාන කරුනු නම් කර පහත සඳහන් දෑ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් පෙන්නුම් කරන්න.**

රටක නිෂ්පාදන ධාරිතාවය තීරණය කරන සාධක දෙකකි.

- සම්පත් සම්භාරය          - සාධක ඵලදායීතාවය.    (ලකුනු 02යි.)


(අ) 10% ක ආර්ථික වෘද්ධියක්





පරිමාණයට 10% පෙන්විය යුතුය.

**(ආ) ඛනිජ තෙල් සැපයුම අඩාල වීම නිසා භාණ්ඩ නිෂ්පාදනය කෙටිකාලයක් තුළ අඩාලවීම.**


.




**(ඉ) රටතුළ ඉඩෝරයක් පැවතීම.**




**(ඊ) රටක් ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වී හුවමාරුවේ වාසි ලබා ගැනීම. (ලකුනු1x4යි)**




B වැනි ලක්ෂ්‍යක පරිභෝජනය ජාත්‍යන්තර පවෙළෙඳාමේ හුවමාරුවේ වාසිය නිසාවෙනි.

(නිවැරදි රූප සටහන් 4 ට ලකුණු 2 කි.)

**2. (අ)** (i) සාමාන්‍ය භාණ්ඩයක මිල වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවීමට බලපාන ප්‍රතිවිපාක දෙක පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

සාමාන්‍ය භාණ්ඩයක මිල වැඩි වන විට ඉල්ලුම් ප්‍රමාණය අඩු වීමට බප්‍රධාන වශයෙන් බලපාන ප්‍රතිවිපාක දෙක වනුයේ , ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකයයි.

- **ආදේශන ප්‍රතිවිපාකය**

අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සළකා බලන භාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යනවිට සෙසු (ආදේශන) භාණ්ඩ වල මිලට සාපේක්ෂව සළකා

බලන භාණ්ඩය අලාභදායී වන හෙයින් ඉල්ලුම් ප්‍රමාණය අඩු කරයි. මෙය ආදේශන ප්‍රතිවිපාකය යටතේ සිදුවන බලපෑමයි. (ලකුනු 02යි.)

- **ආදායම් ප්‍රතිවිපාකය**

මුදල් ආදායම ඇතුළු අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සළකා බලන භාණ්ඩයේ මිල ඉහළ යන විට මූර්ත ආදායම හෙවත් , මුදල් ආදායමේ ක්‍රය ශක්තිය අඩු වී, ඉල්ලුම් ප්‍රමාණඉය අඩු වෙයි. මෙය ආදායම් ප්‍රතිවිපාකයේ බලපෑමයි. (ලකුනු 02යි.)

(ii) එක්තරා හාන්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහතින් දැක්වේ.

Qd = 16 - p (ඉල්ලුම් සමීකරණය )

Qs = -4 + p (සැපයුම් සමීකරණය )

ඒකකයක රුපියල් මිල P වලින් දැක්වෙන අතරඒකක ප්‍රමාණය දහස් වලින් Q වලින් දැක්වේ.

(a) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුනු 02යි.)

Qd = Qs

16 – P = -4 + p

16 + 4 = p + p

20 = 2p

20/2 = P

10 = P සමතුලිත මිල රු. 10/= කි (ලකුනු 01යි.)

Qd = 16 – p = 16 – 1 x 10

Qd = 16 – 10 = 6 සමතුලිත ප්‍රමාණය ඒකක 6 කි. (ලකුනු 01යි.)

**(b) සමතුලිතයේ දී අයභාරය ගණනය කරන්න. (ලකුනු 02 යි.)**

සමතුලිතයේ දී අයභාරය = සමතුලිත මිල x සමතුලිත ප්‍රමාණය

= 10 x 6 = 60 රු. 60/= කි. (ලකුනු 02 යි.)

**(ආ)** තරඟකාරී වෙළෙඳ පොළක කිසියම් හාන්ඩයක වෙළෙඳ පොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සරල රේඛීය වේ. එම හාන්ඩයේ පහත තොරතුරු ඔබට දී ඇත.

| මිල රුපියල් | අධි ඉල්ලුම් ප්‍රමාණය | ඉල්ලුම් ප්‍රමාණය | **සැපයුම** |
|---|---|---|---|
| 20 | 400 | 500 | **100** |
| 100 | -400 | 100 | **500** |

(i) ඉල්ලුම් සැපයුම් සමීකරණ ගොඩ නගා සමතුලිත මිල හා ප්‍රමාණයන් ගණනය කොට එය ප්‍රස්ථාර ගත කිරීමෙන් තහවරු කරන්න. (ලකුනු 04 යි.)

ඉල්ලුම් සමීකරණය සැපයුම් සමීකරණය

$Qd = a - bp$

$500 = a - 400/80 \times 20$

$500 = a - 5 \times 20$

$500 = a - 100$

$500 + 100 = a$

$600 = a$

**$Qd = 600 – 5p$**

$Qs = a + bp$

$100 = a + 400/80 \times 20$

$100 = a + 5 \times 20$

$100 = a + 100$

$100-100 = a$

$0 = a$

**$Qs = 5p$**

$Qd = Qs$

$600 – 5p = 5p$

$600 = 5p + 5p$

$600 = 10p$

$600/10 = P$

සමතුලිත මිල $60 = P$ ( ලකුණු 01 යි.)


$Qd = 600 – 5 \times 60$

$Qd = 600 - 300$

$Qd = 300$ (

(ලකුණු 01 යි.)

(සමතුලිත ප්‍රමාණය)




( ලකුණු 02 යි.)

**(ii) සමතුලිත මිලේ දී ආර්ථික අතිරික්තය ගණන් බලන්න.** **(ලකුණු 03 යි.)**

පාරිභෝගික අතිරික්තය = $(120 – 60)\ 300/2 = 60 \times 150 = 9000$ ( ලකුණු 01 යි.)

නිෂ්පාදක අතිරික්තය = $(60 – 0)\ 300/2 = 60 \times 150 = 9000$ ( ලකුණු 01 යි.)

ආර්ථික අතිරික්තය = $9000 + 9000 = 18000$ ( ලකුණු 01යි.)

විකල්ප පිළිතුර

$(120 - 0) \times 300/2 = 120 \times 150 = 18000$

**(iii) තරඟකාරී වෙළෙඳ පොළ සමතුලිත නිමැවුමේ දී සම්පත් භාවිතය කාර්යක්ෂමව සිදුවන බවට, දැක්විය හැකි කොන්දේසි දෙකක් දක්වන්න.** **( ලකුනු 02 යි.)**

නිදහස් තරගකාරී වෙළෙඳ පොළක සමතුලිත නිමැවුම , සම්පත් කාර්යක්ෂමව බෙදී යන නිමැවුමක් වන්නේ, පහත සඳහන් හේතු නිසාය.

- ආන්තික ප්‍රතිලාභ /මිල = ආන්තික පිරිවැය වීම $MB/P = MC$
- ආර්ථික අතිරික්තය උපරිම වීම.
- පාරිභෝගිකයා ගෙවන මිල = නිෂ්පාදකයා ලබන මිල
  (ඕනෑම කොන්දේසි 2 කට ලකුනු 2 යි.)

**(iv) භාණ්ඩයක සැපයුම් නම්‍යතාවය නම්‍ය වීමට බලපෑ හැකි හේතු තුනක් දක්වන්න.**
**(ලකුනු 03යි.)**

- කර්මාන්ත අතර සම්පත් සංචලනය කිරීමේ හැකියාව පහසුවීම.
- භාණ්ඩ තොග රැස්කර තබා ගැනීමේ හැකියාව ඉහළ යාම.
- මිල වෙනස් වීමෙන් පසු කාලය දිගු වීම.
- කර්මාන්තයේ ඌණ ධාරිතාවයක් තිබීම.
- යෙදවුම් පහසුවෙන් ලබාගත හැකි වීම.
- ඉක්මනින් නශ්‍ය නොවීම. (ඕනෑම කරුණු 3 කට ලකුනු 03යි.)

3\. (i)(අ) කෘෂි භාණ්ඩ වල මිල උච්චාවචනයට බලපාන සාධක මොනවා ද ? (ලකුණු 03යි.)

- කෘෂි භාණ්ඩ ඉල්ලුම අනම්‍ය (මිල හා ආදායම සමග) වීම.
- කෘෂි භාණ්ඩ වල සැපයුම අනම්‍යවීම. (මේරීමේ පමාව)
- කෙටිකාලීන භෝගවල වෙළෙඳපොළ මිල කෙරෙහි නිෂ්පාදන සංවේදීතාව ඉතා අඩුවීම.
- ස්වභාවික හේතු මත සැපයුම දැඩි උච්චාවචනයන්ට ලක්වීම.
- රාජ්‍ය ප්‍රතිපත්තිය හා රජය වෙළෙඳපොළට කරන මැදිහත්වීම්.
- කල්තබාගත නොහැකිවීම.ගෝලීය වෙළෙඳපොළ ගතික තත්වයන්


(ලකුණු 1 x 3 )

**(ආ) නිෂ්පාදන සළාක නියම කිරීම මගින් කෘෂි භාණ්ඩ වල මිල ස්ථායීකරණය සිදුවන ආකාරය රූප සටහන් ඇසුරින් පැහැදිළි කරන්න.** **(ලකුණු 03යි.)**

කිසියම් කාලසීමාවක් තුළ යම් භාණ්ඩයකින් නිපදවිය හැකි නිමැවුම් පිළිබඳ උපරිම සීමාව ආණ්ඩුව විසින් නියම කිරීමයි.

කෘෂි භාණ්ඩ මිල නිතර දැඩි උච්චාවචනයට ලක්වීම නිසා ආදායම් වල හටගන්නා අස්ථායිතාවයනුත් ඉවත් කොට ස්ථාවරත්වයත් ලබාදීම රජයේ අරමුණයි.

සලකා බලන කාලසීමාව තුළ ආණ්ඩුව විසින් නිෂ්පාදකයන්ට සලාක නියම කිරීමෙන් වෙළෙඳ පොළට පැමිණෙන සැපයුම සීමා කිරීමෙන් වෙළඳ පොළ මිල ඉහළ මට්ටමින් ස්ථාවරව තබා ගැනීමට නිෂ්පාදන සලාක නියම කිරීමයි. (ලකුණු 01) .






(ලකුණු 01)

නිෂ්පාදන සලාක නියම කිරීමට පෙර වෙළෙඳපොළ සමතුලිතය p1 හා Q2 වේ. නිෂ්පාදන සලාක නියම කල පසු සැපයුම් වක්‍රය SQ වේ. එවිට වෙළෙඳපොළ හුවමාරුවන ප්‍රමාණය Q1 දක්වා පහළ ගොස් මිල P2 දක්වා ඉහළ යයි. මෙහිදී සමාජ ශුභ සාධන අහිමිවීමක් සිදු වේ. (ලකුණු 01)

(ii) කිසියම් භාණ්ඩයකට නිෂ්පාදන සහනාධාරයක් ලබා දීම හේතුවෙන් වෙළෙඳපොළ මිලට කිසිදු බලපෑමක් සිදු නොවන අවස්ථාවන් කවරේ ද?එවැනි අවස්ථාවක සහනාධාරයේ වාසිය කවුරුන් විසින් අත්පත් කරගන්නේ ද යන්න රූපසටහනක් ආධාරයෙන් පෙන්වන්න. (ලකුණු 06 යි)

පූර්ණ නම්‍ය ඉල්ලුම පූර්ණ අනම්‍ය සැපයුම (ලකුණු 02)




(නිවැරදි ප්‍රස්ථාරයට ලකුණු 01 බැගින් ලකුණු 02)

සම්පූර්ණ වාසිය නිෂ්පාදකයාට සම්පූර්ණ වාසිය නිෂ්පපාදකයාට (ලකුණු 02)


Past Papers Wiki

**(iii)** **කිසියම් භාණ්ඩයකට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.**

**Qd = 200 – 5P** **Qs = - 20 + 5P**

**මෙම භාණ්ඩය මත රජය විසින් රු. 12/= ක උපරිම මිලක් පැනවීමට රජය තීරණය කරයි.**

**(අ ) උපරිම මිල නියම කළ පසු කළු කඩ මිලක් තීරණය වී ඇත්නම්, එවන් තත්ත්වයක් යටතේ පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයට වන බලපෑම ගණනය කරන්න.(ලකුණු 04 යි.)**




පසු පාරිභෝගික අතිරික්තය = 8 x 20 = 160

පෙර පාරිභෝගික අතිරික්තය = 18 x 90/ 2 = **810**

පාරිභෝගික අතිරික්තයේ වෙනස = **160 – 810 = - 650**

පාරිභෝගික අතිරික්තය 650 කින් අඩු වී ඇත. (ලකුණු 02)

පසු නිෂ්පාදක අතිරික්තය = (20 + 28) x 40/ 2

48 x 20 = 960

පෙර නිෂ්පාදක අතිරික්තය = 18 x 90/ 2 = **810**

නිෂ්පාදක අතිරික්තයේ වෙනස = **960 – 810 = 150**

නිෂ්පාදක අතිරික්තය 150 කින් වැඩි වී ඇත. (ලකුණු 02)

**ආ) අධි සැපයුම හෝ අධි ඉල්ලුම කොපමණ ද ?** (ලකුණු 02)

අධි ඉල්ලුම = 140 – 40 = **100**

**ඇ) වෙළෙඳ පොළ භාණ්ඩ හිගය ඉවත් කිරීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග දක්වන්න. (ලකුණු 02)**


- ආනයනය කිරීම
- දේශීය නිෂ්පාදන දිරිගැන්වීම.(නිෂ්පාදන සහවනාධාර)
- ආදේශන නිෂ්පාදනය දිරිගැන්වීම හා පාරිභෝගිකයන් ආදේශන වලට හුරුකිරීම.

PAST PAPERS WIKI

**(4)** **(i) යෙදවුම්, නිෂ්පාදිතය හා නිෂ්පාදනය යන සංකල්ප හඳුන්වන්න.** (ලකුණු 03 යි.)

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කරන සම්පත් යෙදවුම් වේ.
- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කරන ස්ථාවර සම්පත් හා විචල්‍ය සම්පත් යෙදවුම් වේ.
- භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා භාවිතා කරන දෑ යෙදවුම් වේ. .
  (ඉහත කුමන ආකාරයකට දක්වා තිබුණ ද ලකුණු 1 කි)
- නිෂ්පාදිතය යනු නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස බිහිවන භාණ්ඩ හා සේවා වේ.
- ස්ථාවර යෙදවුම් හා විචල්‍ය යෙදවුම් මිශ්‍ර කරමින් භාණ්ඩ හා සේවා නිපදවීමේදී එම නිෂ්පාදන ක්‍රියාවලියේදී ප්‍රතිඵලයක් ලෙස බිහිවන නිමවුම් නිෂ්පාදිතය වේ.(ල.1කි)
- නිෂ්පාදනය යනු කිසියම් තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කරමින් යෙදවුම්, නිමවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය . හෝ (ල.1කි)
  යෙදවුම් භාවිත කොට භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ මිනිස් ක්‍රියාකාරකමකි.

(ii) නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී යෙදවුම් වැඩි කරමින් භාන්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ දී මුළු ඵලදාව , සාමාන්‍ය ඵලදාව , හා ආන්තික ඵලදාවේ හැසිරීම ජ්‍යාමිතිකව නිරූපනය කරමින් පැහැදිලි කරන්න. (ලකුනු 04යි.)




(නිවැරදි රූප සටහනට ලකුණු 02 කි. එකම රූප සටහනේ රූප සටහන් දෙකම ඇඳ ඇත්නම් ද ලකුණු02 දෙන්න.)

- මුළු නිෂ්පාදිතය මුලදී වේගයෙන් ඉහළ ගොස් පසුව අඩුවන වේගයෙන් වැඩි වී පසුව උපරිම වී තව දුරටත් විචල්‍ය යෙදවුම් වැඩිකරන විට නිමවුම ක්‍රමයෙන් අඩුවේ.
- මුළු නිෂ්පාදිතය වේගයෙන් ඉහළ නගින විට ආන්තික නිෂ්පාදිතය උපරිම වන අතර, මුළු නිෂ්පාදිතය අඩුවන වේගයෙන් වැඩි වන විට ආන්තික නිෂ්පාදිතය ක්‍රමයෙන් අඩු වී සාමාන්‍ය ඵලදා වක්‍රයේ උපරිම ලක්ෂ්‍යය ඡේදනය කරමින් පහළට ගමන් කරයි. මුළු නිෂ්පාදිතය උපරිම වන විට ආන්තික නිෂ්පාදනය ශූන්‍ය වේ.
- සාමාන්‍ය නිෂ්පාදිතය (AP) විචල්‍ය යෙදවුම් ක්‍රමයෙන් වැඩි වන විට ක්‍රමයෙන් වැඩි වී පසුව උපරිම වී තව දුරටත් යෙදවුම් වැඩි කරන විට සාමාන්‍ය නිෂ්පාදිතය ක්‍රමයෙන් අඩු වේ.
- AP වැඩි වන විට ඊට වඩා වැඩි වේගයෙන් MP වැඩි වන අතර AP අඩුවන විට ඊට වඩා වැඩි වේගයෙන් MP අඩු වේ. (ලකුණු 2)

**(iii) පූර්ණ තරගකාරී ආයතනයක ආර්ථික ලාභ ශූන්‍ය වීම, අවාසි දායක තත්ත්වයක් ද? ඔබ ආයතනයේ ව්‍යවසාකයා යැයි සිතා මෙම අවස්ථාව ආර්ථික විද්‍යාත්මකව පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)**

කිසියම් ආයතනයක ආර්ථික ලාභ ශූන්‍ය විම සිදු වන්නේ එම ආයතනයේ මුළු ආදායම මුළු වියදමට සමාන වන අවස්ථාවේදිය. එනම් ආයතනයක TR=TC වන විට ආයතනයක් ප්‍රමාණික ලාභ උපයයි. නැතහොත් ආයතනයක ඒකකයක මිල සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වන අවස්ථාවේදී එම ආයතනය (P=ATC) ප්‍රමාණික ලාභ උපයයි. (ලකුණු 1)

ආයතනයක ආර්ථින ලාභ ශූන්‍ය වීම අවාසිදායක තත්වයක් ලෙස නොසලකයි.
ආයතනයක ආර්ථික ලාභ ශූන්‍ය වන විට මුළු ආදායමට මුළු වියදම සමාන නිසා ලැබෙන ආදායමෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දැරීමට සිදු වන ස්ථාවර වියදම් හා විචල්‍ය වියදම් පියවා ගැනීමට හැකි වේ. (ලකුණු 1)
ආර්ථික ලාභ ශූන්‍ය වන විට ව්‍යාපාරය වසා දැමීමක් සිදු කල හොත් ව්‍යාපාරය වෙනුවෙන් දැරූ ස්ථාවර වියදම් හා විචල්‍ය වියදම් නැවත ලබා ගැනීමට නොහැකි විමෙන් පාඩුවක් සිදු වේ. (ලකුණු 1)
ව්‍යවසායකයකු ව්‍යාපාරයක් තුළින් අපේක්ෂිත ලාභය වන්නේ ප්‍රාමාණික ලාභයයි. ප්‍රාමාණික ලාභයකදි ව්‍යවසායකයා කර්මාන්තය අතහැර තමා ආයෝජනය පිටතට ගෙන යාම වැලැක්වීමට සමත් වේ. ප්‍රමාණික ලාභය ප්‍රාග්ධනයේ හා අවධානම් දැරීමේ ආවස්ථික පිරිවැය පියවීමට ප්‍රමානවත් බැවින් නිෂ්පාදකයා තව දුරටත් නිෂ්පාදනයේ රැඳී සිටී.
(ලකුණු 1)

**(iv) පරිමාණානුකූල පිරිමැසුම් හා පරිමානානුකූල නොපිරිමැසුම් ඇතිවීමට බලපාන හේතු 2 බැගින් ලියන්න. (ලකුනු 04 යි.)**

- පරිමාණානුකූල පිරිමැසුම් යනු දිගුකාලයේදී නිෂ්පාදන ආයතනයක් තම නිමවුම් ප්‍රමාණය ප්‍රසාරණය කරන විට දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටීමයි. පරිමාණානුකූල පිරිමැසුම් අභ්‍යන්තර පිරිමැසුම් හා බාහිර පිරිමැසුම් මත බිහිවේ.
- පරිමාණානුකූල පිරිමැසුම් බිහිවීමට පහත සාධක බලපායි.

1. ධාරිතාව විශාල වීම නිසා හට ගන්නා තාක්ෂණික පිරිමැසුම්
2. කළමනාකරණය ආශ්‍රිත පරිමාණානුකූල පිරිමැසුම්
3. අලෙවිකරණය හා සම්බන්ධ පරිමාණානුකූල පිරිමැසුම්
4. මූල්‍යමය පරිමාණානුකූල පිරිමැසුම්
5. අවදානම් දැරීම හා සම්බන්ධ පරිමාණානුකූල පිරිමැසුම්

- පරිමාණානුකූල නොපිරිමැසුම් යනු නිෂ්පාදන ආයතනයක් දිගුකාලයේදී නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමේදී ආයතනයේ ඒකක පිරිවැය ඉහළයාම සඳහා බලපාන සාධක වේ.
- පරිමාණානුකූල නොපිරිමැසුම් බිහි විමට බලපාන සාධක නම්,

1. තීරණ ගැනීමේ කල්පමාව
2. සම්පත් හීනවිම
3. තාක්ෂණික නොපිරිමැසුම්
4. අලෙවිකරණය හා සම්බන්ධ ගැටලු මත පිරිවැය වැඩි විම.
5. මූල්‍යමය පරිමාණානුකූල නොපිරිමැසුම්

(v) කිසියම් නිෂ්පාදන ආයතනයක් සම්බන්ධව එක් මසක තොරතුරු පහත දැක්වේ. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| පරිපාලන වියදම් | 20000 |
| වැටුප් ගෙවීම් | 16000 |
| ප්‍රාමාණික ලාභය | 24000 |
| අමුද්‍රව්‍ය වියදම් | 42000 |
| පොලී ගෙවීම් | 22000 |
| ඉන්ධන සඳහා වියදම් | 8000 |
| බදු කුලිය | 18000 |
| භාණ්ඩ ඒකකයක මිල | 800 |
| නිෂ්පාදන ඒකක ප්‍රමාණය | 250 |

**(අ) මුළු විචල්‍ය පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය (ලකුනු 02 යි.)**

V. (ආ) මුළු විචල්‍ය පිරිවැය = වැටුප් ගෙවීම + අමුද්‍රව්‍ය වියදම් + ඉන්ධන වියදම් + පරිපාලන වියදම්

= 16000 + 42000 + 8000 + 20000 = 86000

(ලකුණු 1)

**<u>(පරිපාලන වියදම් නිෂ්පාදනය සමග නොබැඳනු ස්ථාවර පිරිවැයක් ලෙස සළකා පිළිතුර ලබා දී ඇත්නම්, එය ද නිවැරදි පිළිතුරක් ලෙස සළකන්න.)</u>**

මුළු ස්ථාවර පිරිවැය = ප්‍රාමාණික ලාභය +ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවීම් + බදු කුළිය

= 24000 + 22000 + 18000

= 64000 (ලකුණු 1)

(ආ) මුළු අයභාරය හා මුළු පිරිවැය (ලකුනු 02 යි.)

මුළු අයභාරය = 800 X 250

= 200000

මුළු වියදම = ස්ථාවර පිරිවැය + විචල්‍ය පිරිවැය

= 150000 (ලකුණු 2)


(ඇ) ආර්ථික ලාභය හෝ අලාභය (ලකුනු 01 යි.)

ආර්ථික ලාභය = මුළු ආදායම - මුළු වියදම

= 200000 – 150000

= 50000 (ලකුණු 1)

(5)(i) ආර්ථික පසු බැසීම හා ප්‍රසාරණය යන්න ව්‍යාපාර චක්‍ර මගින් පැහිදිළි කරන්න. (ලකුනු 04 යි.)




(ලකුණු 02)

පසු බැසීම/ ප්‍රතිගමනය/ සංකෝචනය

මාස 6 කට වැඩි (කාර්තු දෙකකට) වසරකට අඩු කාලයක් මූර්ත නිමැවුම අඩු වීමයි. මෙම තත්ත්වය සමස්ත වියදමේ ඌනාවයක් මත සිදුවන අතර එහි දී මූර්ත නිමැවුම

බඅඩු වීම, විරුකියාව ඉහළ යාම, අවධමන තත්ත්වයන් ඇති වීම, යන ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරිත්වය අහිතකර තත්ත්වයකට පත් වෙයි. (ලකුණු 01)

**ප්‍රසාරණය:-**

මෙහි දී සමස්ත වියදම ඉහල යාමත් , සමග සේවා නියුක්තිය මූර්ත නිමැවුම ඉහළ යන අතරම උද්ධමන පීඩනයක් ද දැකගත හැකිය. (ලකුණු 01)

(ii) කල්පිත ආර්ථිකයක් සම්බන්ධ පහත තොරතුරු ඔබට සපයා ඇති අතර, සියළු දත්ත රු. බිලියන වලිනි.

| | |
|---|---|
| දළ දේශීය වියදම | 1850 |
| පෞද්ගලික පරිභෝජනය | 900 |
| රජයේ පරිභෝජනය | 600 |
| ශුද්ධ අපනයන | -100 |
| අපනයන | 300 |
| විදේශ ගිණුම් වල වර්තන ගිණුමේ ශේෂය | -150 |

(අ) දළ ආයෝජනය (ලකුණු 01 යි.)

දළ ෙද්ශීය වියදම = රජෙය් හා පෞද්ගලික + දළ ආයෝජනය

1850 = (900 + 600) + දළ ආයෝජනය

1850 = 1500 + දළ ආයෝජනය

1850 - 1500 = දළ ආයෝජනය

350 = දළ ආයෝජනය (ලකුණු 01 යි.)

(ආ) දළ දේශිය නිෂ්පාදිතය (ලකුණු 01 යි.)

දළ දේශීය නිෂ්පාදිතය = දළ දේශීය වියදම + ශුද්ධ අපනයන

= 1850 – 100

= 1750

(ඉ) දේශීය හා ජාතික ඉතුරුම් (ලකුණු 02 යි.)

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය/ දළ ආයෝජනය + ශුද්ධ අපනයන

= දේශීය ඉතුරුම් 350 + -100 = 250

හෝ

දළ දේශීය නිෂ්පාදිතය - රජයේ හා පෞද්ගලික පරිභෝජනය = දේශීය ඉතුරුම්

1750 - 1500 = 250 (ලකුනු 01)

වැය කළ හැකි ජාතික ආදායම - රජයේ හා පෞද්ගලික පරිභෝජනය =

වැය කළ හැකි ජාතික ආදයම =
දළ දේශීය වියදම + විදෙශ වර්තන ගිණුමේ ශේෂය 1850 + - 150 = 1700

1700 - 1500 = ජාතික ඉතුරුම්

1700 – 1500 = ජාතික ඉතුරුම්

200 = ජාතික ඉතුරුම් (ලකුණු 01 යයි)

(ඊ) තුළිත ශේෂ සාමාන්‍ය

මුළු සම්පත් = දළ දෙශීය නිෂ්පාදිතය + ආනයන

= 1750 + 400

= 2 150 (ල.01)

සම්පත් උපයෝජනය = දළ දේශී වියදම + අපනයන

= 1850 + 300

= 2150 (ලකුණු 01)

අපනයන - ආනයන = ශුද්ධ අපනයනය
300 - ආනයන = - 100
300 + 100 = 400 (ආනයන )

(iv)

| වැයකළ හැකි ආදායම (රු.) | පරිභෝජන වියදම රු. |
|---|---|
| 0 | 500 |
| 5000 | 4500 |
| 10000 | 8500 |
| 15000 | 12500 |
| 20000 | 16500 |
| 25000 | 20500 |

(අ) මීට අදාළ පරිභෝජන ශ්‍රිතය ගොඩ නගන්න. (ලකුණු 02 යි)

$C = a + \frac{\Delta c}{\Delta Yd} Yd \quad = \quad 4500 = a + \frac{4000}{5000} \times 5000$

= 4500 = a + 0.8 x 5000

= 4500 - 4000 =a

= 500 = **C = 500 + 0.8 yd** (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ ආයෝජනය රු. 820 ක් ද රජයේ වියදම් 500 ක් ද රජයේ ආදායම් බදු 120 ද ශුද්ධ අපනයන - 24 ද වේ නම්, සමතුලිත නිමැවුම සොයන්න. (ලකුණු 03 යි

Y = C + I + G + ( X – M )

Y = 500 + 0.8 (Y – 120) + 820 + 500 + (-24) (ලකුණු 01)

Y = 1820 + ( - 96) + (-24) + 0.8y

Y-0.8y = 1820 – 120 (ලකුනු 01)

0.2y = 1700

Y = 1700 /0.2 = 17000/2 **= 8500** (ලකුණු 01)

**(ඇ)ආදායම 25000 දී සාමාන්‍ය පරිභෝජන නැමියාව හා සාමාන්‍ය ඉතුරුම් නැමියාව සොයන්න. (ලකුණු 02යි.)**


සාමාන්‍ය පරිජභෝජන නැමියාව APC = C/Yd = 20500/25000 = 0.82 (ලකුනු 01)

සාමාන්‍ය ඉතුරුම් නැමියාව APS = S/Yd = 4500/25000 = 0.18 (ලකුනු 01)

**"ආ" උප කොටස**

(6) **(i) සැපයුමෙන් තල්ලු වූ උද්ධමනය (පිරිවැයෙන් තල්ලු වූ) රූපසටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න.** (ලකුණු 02 යි.)

. පිරි වැයෙන් තල්ලු වූ උද්ධමනය යනු සමාහාර ඉල්ලුම ස්ථාවරව තිබිය දී සමාහාර සැපයුම අඩුවීම තුළිමට්ටම ඉහළ යාමයි.




සමාහාර ඉල්ලුම් වක්‍රය (AD) ස්ථාවරව තිබිය දී සමාහාර සැපයුම් (AS) වක්‍රය AS1 සිට AS2 හා AS3 දක්වා වමට විතැන්වීම නිසා මිල මට්ටම P1 සිට P2 දක්වාද පසුව P3 දක්වා ඉහළ යයි.

(ii) මිනිසුන් විසින් මුදල් ඉල්ලුම් කරකනු ලබන්නේ ඇයි? ඒ සඳහා බලපාන සාධක කවරේ ද? (ලකුණු 04 යි.)

පහත චේතනා 03 සඳහා මුදල් ඉල්ලුම් කරයි. (ලකුණු 02)

1. ගනුදෙනු චේතනාව
2. ආරක්‍ෂණ චේතනාව
3. සමපේක්ෂණ චේතනාව

ඒ සඳහා බලපාන සාධක (ලකුණු 02)

- මූර්ත ආදායම
- පොලී අනුපාතිකය
- මිල මට්ටම
- අනාගත උද්ධමනය හා විනිමය අනුපාතික පිළිබඳ අපේක්ෂා
- මූල්‍ය ක්‍රමයේ නව්‍යතාවයන්

Past Papers Wiki

(iii) බැංකු පද්ධතියක් තුළ ඇති එක්තරා වානිජ බැංකුවක් සතුව රු. මි. 1500 ක තැන්පතුවක් පවතී. රු. මි. 1000 ක ප්‍රාග්ධන හිමිකම් ඇත. රු. මි. 400 ක සංචිත පවතින මෙම බැංකුව රු. මි. 1100 ක ණය නිකුත් කොට ඇත. තව ද රු. මි. 1000 ක සුරැකුම්පත් ද පවතී.

(අ) මෙම බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය දක්වන්න. (ලකුණු 02යි.)

| වගකීම් | රු. මි. | වත්කම් | රු. මි. |
|---|---|---|---|
| තැන්පතු<br>ප්‍රග්ධන හිමිකම් | 1500<br>1000 | සංචිත<br>ණය<br>සුරැකුම්පත් | 400<br>1100<br>100 |
| එකතුව | 2500 | එකතුව | 2500 |

(ආ) මෙම වානිජ බැංකුව සතුව අධි සංචිත ලෙස රු. මි. 100 ක් පවතී නම්, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කරන්න. (ලකුණු 02 යි.)

ව්‍යවස්ථාපිත සංචිතය = සංචිත - අධි සංචිත

= 400 – 100

= 300 (ලකුණු 01)

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

$\frac{R \times 1500}{100} = 300$

$\frac{1500x\%}{1500} = \frac{30000}{1500}$

$R\% = 20$

$= 20\%$ (ලකුණු 01)

හෝ

සංචිත අනුපාතිකය $= \frac{300 \times 100}{1500}$

$= 20\%$

අධි සංචිත = 100

අළුතින් ලැහුණු තැන්පත් වලින් = 500 x 80/100 = 400 (20%

මුළු අධි සංචිත ප්‍රමාණය = 100 + 400 = 500

(ඉ) මෙම වානිජ බැංකුවට රු. මි. 500 ක නව තැන්පතුවක් ලැබුණ පසු බැංකු පද්ධතියට ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය දකත්වන්න. (ලකුණු 02 යි.)

අධි සංචිත = සංචිත - ව්‍යවස්ථාපිත සංචිත

= 900 – 400

= 500 (ලකුණු 01)

ලබා දිය හැකි නව ණය ප්‍රමාණය = k x අධි සංචිතය

$k = 1/r$

$k = \frac{1}{20/100}$

$k = 100/20$

$= 5$

PAST PAPERS WIKI

= 5 x 500

= 2500 (ලකුණු 01)

(iv) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව තම මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමානයේ භාවිතා කරනු ලබන ප්‍රධාන උපකරණ මොනවා ද? (ලකුණු 03 යි)

1. විවට වෙළෙඳ පොළ කටයුතු
2. නිත්‍ය පහසුකම්
3. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොළී අනුපාතිකයක ක්‍රම වේදය සිට තනි ප්‍රතිපත්ති පොළි අනුපාතික ක්‍රම වේදයකට මාරු වීමේ ප්‍රතිලාභ කවරේ ද? (ලකුණු 03 යි.)

මූල්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂමව සහ සැලකිය යුතු ලෙස ඉහළ යාම.

1. මූල්‍ය වෙළෙඳ පොළට පැහැදිලි හා ස්ථාවර සංඥා ලබා දීම.
2. මූල්‍ය ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳව ඇති විය හැකි අවිනිශ්චිතතා ඉවත්වීම.
3. වෙළෙඳපොළට සහභාගි වන්නන්ට වැඩි විශ්වාසයකින් යුක්තව දැනුවත් තීරණ ගැනීමට හැකිවීම.
4. වෙළෙඳපොළ පොලී අනුපාත වල විෂමතා නිර්මාණය අවම කරයි.

(ඕනෑම කරුණු 1 ට ලකුණු 1 බැගින් ලකුණු 03යි.)

(ඉ) බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය යනු කුමක් ද? එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන මුදල් ප්‍රතිපත්ති රාමුව සමග සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 0යි.)

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය යනු අන්තර් බැංකු ඒක්ෂණ මුදල් ගනුදෙනු වල එනම් එක්දින පදනමින් වාණිජ බැංකු අන්තර් සුරකුම් රහිතව සිදු කරන ගනුදෙනු වල බරිත සාමාන්‍ය පොලී අනුපාතිකයයි. (ලකුණු 01)

ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන මූල්‍ය ප්‍රතිපත්තිය නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුවයි. මෙම නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුව තුළ මෙහෙයුම් ඉලක්කය වන්නේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයයි. මෙම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමානව හෝ ආසන්නව පවත්වා ගැනීම අරමුණු කරයි.


(ලකුණු 01)

7. (i) සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ පැහැදිළි කර , වෙළෙඳ පොළ ආර්ථිකයක් මෙය නොසැළකීම නිසා වෙළෙඳ පොළ අසමත් වන ආකාරය පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

කිසියම් පුද්ගලයෙක් ආර්ථික කටයුත්තක නිරතවීම නිසා ඒ වෙනුවෙන් දරණ පිරිවැය පෞද්ගලික පිරිවැය වේ. එම කටයුත්තට සම්බන්ධයක් නොමැති පාර්ශවයන් දරණ පිරිවැය බාහිර පිරිවැය වේ. මෙම පෞද්ගලික පිරිවැය හා බාහිර පිරිවැයෙහි එකතුව සමාජ පිරිවැය වේ. (ලකුනු 01යි.)

ආර්ථික කටයුත්තක් නිසා ලැබෙන පෞද්ගලික ප්‍රතිලාභ හා බාහිර ප්‍රතිලාභ වල එකතුව සමාජ ප්‍රතිලාභ වේ. (ලකුනු 01 යි.)

වෙළෙඳ පොළ ආර්ථිකයේ පෞද්ගලික පිරිවැය හා ප්‍රතිලාභ පමණක් පදනම්ව කටයුතු කරයි. සමාජ පිරිවැය හෝ ප්‍රතිලාභ නොසැළකීම නිසා අධි නිෂ්පාදන , ඌණ නිෂ්පාදන හෝ අධි පරිභෝජන , ඌණ පරිභෝජන ඇතිවේ. (ලකුනු 01 යි.)




සමාජ පිරිවැය පැවතීම නිසා වෙළෙඳ පොලේ අධි නිෂ්පාදනයක් පැවතීම පැහැදිළි කළ හැක.

(රූප සටහනට ලකුණු 01 යි.)

(ii) ‘‘සාධාරණ බව ’’යන බදු මූලධර්මය පැහැදිළි කර එහි ප්‍රභේද නම් කරන්න. (ලකුනු 04 යි.)

ඉහළ ආදායම් ලාභින්ගෙන් ඉහළ බදු ප්‍රතිශතයයකුත් පහළ ආදායම් ලාබීන් ගෙන් පහළ බදු ප්‍රතිශතයකුත් අය කිරීම මෙහි දී වැදගත් වේ. එසේම පහළම ආදායම් ලාභින් බදු වලින් නිදහස් විය යුතුය. මෙය ආකාර දෙකකි. (ල.02)

1. සිරස් සමානාත්මතාවය (අනුක්‍රමික බදු - ඉහළ ආදායම් ලාභීන්ගෙන් ඉහළ බදු ප්‍රතිශතයක් හා පහළ ආදායම් ලාභින්ගෙන් පහළ බදු ප්‍රතිශතයක් අය කිරීම වේ).
2. තිරස් සමානාත්මතාවය ( සමාන ආදායම් ලාභීන්ගෙන් සමාන බදු ප්‍රතිශතයක්අය කිරීම වේ.)

මීට අමතරව රජය මහජනයාට නොමිලයේ ලබා දෙන සේවාව සඳහා මහජනයා රජයට යම් මුදලක් බදු වශයෙන් ගෙවන්නේ නම් එය ද සාධාරණ වේ.

(iii) **අතුරු අයවැය ලේඛණය, හා අතුරු සම්මත ගිණුම පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)**

අතුරු අයවැය:-

අයවැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙන විට, අළුත් රජයක් බලයට පත් වුවහොත් එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අළුත් අයවැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. එය අතුරු අයවැය ලේඛණය වේ. (ලකුනු 02 යි.)☸

අතුරු සම්මත ගිණුම:-

අයවැය ලේඛනයක් නියමිත පරිදි නියමිත කාලයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ විට, අයවැය ඉතා කෙටි කාලයක් තුල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට පොරොන්දු වෙමින් , එතෙක් රජයේ වියදම් පියවා ගැනීමට ,රජයේ ඒකාබද්ද අරමුදලින් මුදල් වෙන් කර දෙන ලෙස ඉල්ලමින් මුදල් ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ඉල්ලීම වේ.

(iv) සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්තිය යනු කුමක් ද? නිදසුන් යොදා ගනිමින් පැහැදිළි කරන්න. (ලකුනු 04 යි.)

සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්තියක් යනු, අයවැය හිඟය පියවා ගැනීම සඳහා ගන්නා ණය නිසා මුදල් සැපයුම ප්‍රසාරණය නොවේ නම්, එය සංකෝචනාත්මක ප්‍රතිපත්තියක් වේ. (ලකුනු 02 යි.)

රජය වෙළෙඳ පොළ නොවන මූලාශ්‍රයන් වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව , සේවක අර්ථ සාධක අරමුදල , මහජනතාව වැනි වෙළෙඳ පොළ බැංකු නොවන අංශ වලින් ණය ගැනීම නිසා මුදල් සැපයුම ප්‍රසාරණය නොවේ. එවිට උද්ධමනකාරී බලපෑම් ඇති නොවේ. (ලකුනු 02 යි.)

(v) පෞද්ගලීකරණය යනු කුමක් ද? එමගින් ලබා ගත හැකි හිතකර තත්ත්වයන් මොනවා ද? (ලකුනු 04 යි)

පෞද්ගලීකරණය යනු, රජයේ හිමිකාරිත්වය යටතේ පැවති ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීම, බදු දීම, කළමණාකරණය පමනක් පැවරීම වේ. (ලකුනු 02 යි.)

- රාජ්‍ය ඒකාධිකාරිත්වය නැතිවී තරඟකාරිත්වයක් ඇතිවීම.
- ප්‍රාග්ධනය පහසුවෙන් සපයා ගත හැකි වීම..
- ව්‍යාපාරවලට පවතින දේශපාලන බලපෑම ඉවත් වීම.
- වඩාත් ඵලදායී ලෙස නිෂ්පාදන සම්පත් භාවිත කළ හැකිවීම.
- නිෂ්පාදිත වල ගුණක්වය ඉහළ යාම.

8. (i) රටවල් දෙකක් සම්බන්ධව පැන් හා පැන්සල් නිෂ්පාදනයට එක් ඒකකයක් සම්බන්ධයෙන් වැයවන ශ්‍රම පැය ගණන පහත දැක්වේ.

| භාණ්ඩ වර්ගය | A රට | B රට |
|---|---|---|
| පැන් | 4 | 2 |

| | | |
|---|---|---|
| පැන්සල් | 12 | 10 |

(අ) භාණ්ඩ දෙක නිෂ්පාදනය සම්බන්ධයෙන් කාර්යක්ෂම රට කුමක් ද? (ලකුණු 2 යි.)

B රට භාණ්ඩ දෙකෙන්ම නිරපේක්ෂ වාසිය යටතේ හෙවත් අඩු පිරිවැයක් යටතේ භාණ්ඩ දෙකම නිෂ්පාදනය කරනු ලබන බැවින් මෙම රට කාර්යක්ෂම රට වේ. (ලකුණු 02)

(ආ) එක් එක් රට සාපේක්ෂ වාසි අත්පත් කර ගන්නේ කෙසේ ද? (ලකුණු 2 යි.)

A රට පැන් නිපද වීමේ ආවස්ථික පිරිවැය 4/12 = 0.33

B රට පැන් නිපද වීමේ ආවස්ථික පිරිවැය 2/ 10 = **0 .2** කි.

මේ අනුව පැන් නිපද වීමේ සාපේක්ෂ වාසිය ,අඩු ආවස්ථික පිරිවැයක් පවතින B රට හිමිකර ගන්නා අතර ඔවුන් පැන් විශේෂීකරණය කල යුතුය. (ලකුණු 01)

A රට පැන්සල් නිපද වීමේ ආවස්ථික පිරිවැය 12/4 = 3

B රට පැන්සල් නිපද වීමේ ආවස්ථික පිරිවැය 10/2 = 5 කි.

මේ අනුව පැන්සල් නිපදවීමේ අඩු ආවස්ථික පිරිවැය A රට හිමි කර ගන්නා අතර ඔවුන් පැන්සල් නිෂ්පාදනය කරයි. (ලකුණු 01)

(ඉ) එක් එක් රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාත සහ රටවල් දෙකටම වාසි සහගත ජාත්‍යන්තර හුවමාරු අනුපාත පරාසය පෙන්වන්න. (ලකුණු 2 යි.)

A රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය =

පැන් 3 ට පැන්සල් 1 කි .( පැන්සල් 1 ට පැන් 3 කි)

B රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය =

පැන් 5 ට පැන්සල් 1 කි .( පැන්සල් 1 ට පැන් 5 කි)

(රටවල් දෙකෙහිම ඇත්නම් ලක්ණු 01 කි)

ජාත්‍යන්තර හුවමාරු අනුපාත පරාසය = පැන් 1 ට පැන්සල් 0.2 ට වැඩි හා 0. 33 ට අඩු.

= පැන්සල් 1 ට පැන් 3 ට වැඩි හා 5 ට අඩු

ලෙස හුවමාරුව සිදුවිය යුතුය. (ලකුණු 1 යි.)

.

(ii) අන්තර් ජාතික වෙළෙඳාමේ සඵලතාවය විමසන්න . (ලකුණු 4 යි.)

වාසි :-

- අතිරික්ත නිෂ්පාදන අළෙවි කරගත හැකි වීම.
- දේශිය වශයෙන් නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ පරිහරණය කළ හැකි වීම.
- දියුණු තාක්ෂණය ලබා ගත හැකි වීම.
- නිෂ්පාදන හැකියාවට වඩා පරිබෝජන හැකියාව ඉහළ යාම.

- අන්තර්ජාතික සහයෝගීතාවය ඇතිවීම.
- ප්‍රවාහන, බැංකු, රක්ෂණ සේවා දියුණු වීම හා ඒ ආශ්‍රිතව සේවා නියුක්තිය ඉහළ යාම.
- විදේශ ණය ,ආධාර ගලා ඒම.
- ගුනත්වයෙන් යුත් භාණ්ඩ අඩු මිලට පරිභෝජනනය කිරීමේ හැකියාව.
- අමුද්‍රව්‍ය ආනයනය කොට නිෂ්පාදනය රට තුල සිදුවන බැවින් , රටෙහි එකතු කළ අගය වැඩිවී ආර්ථික වර්ධනයක ඇති වීම.
  (කුමන හෝ වාසි 2 ක් ඇත්නම් ලකුණු 02 කි)

අවාසි ;-

- දේශිය කර්මාන්ත අඩාළ වීම.
- විදේශ උද්ධමන තත්ත්වයන් රට තුළට ගලා ඒම.
- දේශීය නිෂ්පාදන පවා (අමුද්‍රව්‍ය පිටරටවලින් ගෙන්වන නිසා ) විදේශ බලපෑම් මත යැපී සිටීමට සිදුවීම.
- විදේශ ගැති වීම.
- අනවශ්‍ය පරිභෝජන රටාවකට යොමු වීම හා ඒ තුළින් ගෙවුම් ශේෂ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වීම.
- දේශීය සමාජ සංස්කෘතියට බලපෑම් එල්ලවීම.
- විදේශ විනිමය ගැටළු වලට මුහුණ දීමට සිදුවීම.
  (කුමන හෝ අවාසි 2 ක් ඇත්නම් ලකුණු 02 කි)

(iii)ගෙවුම් ශේෂයේ වර්තන ගිණුම තුළ පවතින, සේවා ගිණුම තුල ඇතුළත් වන ප්‍රධාන ගණුදෙනු හතරක් ලියන්න. (ලකුණු 2 යි.)

- සංචාරක සේවා
- මුහුදු ප්‍රවාහණ
- ගුවන් ප්‍රවාහණ
- මූල්‍ය සේවා
- විදුලි සංදේශ සේවා
- පරිඝණක සේවා
- ඉදිකිරීම
- අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා ආදිය. (ඕනෑම කරුණු 2 ට ලකුණු 2 කි.)

(iv) ගෙවුම් ශේෂයේ සමස්ත ගිණුමේ හිගයක් දිගු කාලීනව පවතීනම්, සිදු කළ යුතු ක්‍රියා මාර්ග හතරක් ලියන්න. (ලකුණු 2 යි.)

- අපනයයන විවිධාංගීකරණය.
- සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම.

- සාම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම.
- අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම.
- විදේශ රටවල් සමග ගිවිසුම් වලට එළඹීම.
- විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ හැරීම හෝ අවප්‍රමාණය කිරීම.
- දේශිය උද්ධමනය පාලනය කොට, අපනයන වල තරඟකාරිත්වය ඉහල නැංවීම.
- ආනයන ආදේශන කර්මාන්ත වැඩි දියුණු කිරීම.
- අත්‍යවශ්‍ය ආනයනය හැර අවශේෂ ආනයන අධෛර්යමත් කිරීම.

(ඕනෑම කරුණු 2 ට ලකුණු 02 කි.)


(v)විනිමය අනුපජාතිකය උච්ඡාවචනය වීමට බලපාන සාධක හතරක් ලියන්න. (ලකුණු 2 යි.)

- ජාත්‍යන්තර වෙළෙඳාම
- මිල විචලනය.
- සමපේක්ෂණ
- ආර්ථිකයේ ශක්තිය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- දේශපාලන කරුණු
- කොටස් වෙළෙඳ පොල කටයුතු

(ඕනෑම කරුනු 4 ට ලකුනු 2 යයි.)

(v) ශ්‍රී ලංකාවට ඇමරිකානු සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යාම ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතය තීරණය වීමට බලපාන ආකාරය වක්‍ර කියවීම යටතේ රූප සටහනක් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 4 යි.)

- ශ්‍රී ලංකාවට විදේශිකයන් පැමිණි විට ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රුපියලට කරනු ලබන ඉල්ලුම ඉහළ යයි. (ලකුණු 01 යි.)




(ලකුණු 02)

- රුපියල් ඉල්ලුම ඉහළ යාම නිසා රුපියලේ අගය ඉහළ යයි. පෙර පැවති රුපියල් ඉල්ලුම යටතේ රු. 1 = 1/350 කි. ඒනම් ඩොලර්යක් ලබා ගැනීම සඳහා රුපියල් 350 ක් ගෙවිය යුතුය.නමුත් ඉල්ලුම වැඩි වීමෙන් පසු රුපියල් 1 = ඩොලර් 1/ 300 කි. ඒනම් ඩොලරයක් ලබා ගැනීමට පසුව වැයකළ යුත්තේ රුපියල් 300 ක් පමනි. (ලකුණු 01)
-

9. (අ)(i) ආර්තික වෘද්ධිය (වර්ධනය) උපනතියකි.කෙටියෙන්අර්ථ දක්වන්න. (ලකුණු 03 යි.)

ආර්ථික වෘද්ධිය කෙටි කාලීනව සිදුවන නිමැවුමේ වැඩි වීමක් නොව දිගුකාලීනව සිදුවන නිමැවුමේ වැඩිවීමක් නිසා එය උපනතියකි. ඒ අනුව රටක නිෂ්පාදන ධාරිතවයේ ප්‍රසාරනයක් තුළින් මූර්ත නිමැවුමේ ( දළ දේශීය නිෂ්පාදිතයේ / දළ ජාතික ආදායමේ/ ඒක පුද්ගල මූර්ත ආදායමේ සිදුවන නොකඩවා වැඩි වීමකි. (ලකුනු 03 යි.)

(ii) සංවර්ධනය ආර්ථික සංවර්ධනයටත් වඩා පුළුල් සංකල්පයකි.පැහැදිළි කරන්න. (ලකුණු 04 යි.)

සංවර්ධනය , ආර්ථික වෘද්ධියට වඩා පුළුල් සංකල්පයක් යන්නෙන් අදහස් කරනුයේ, ආර්ථික සංවර්ධනයක දී , ආර්ථිකයේ ව්‍යුහමය වෙනස් වීම් සමග ගුණාත්මක වර්ධනයක් අවශ්‍ය වන අතර , සංවර්ධන සංකල්පයේ දී දරිද්‍රතාවය, විරැකියාව, ආදායම් ව්‍යාප්තිය වැනි සාධක ද අදාළ කරගෙන මිනිසාගේ ජීවන තත්ත්වය උසස්වීමක් අපේක්ෂා කරන නිසා එය පුළුල් සංකල්පයකි. (ලකුනු 04 යි.)*

(iii)නිරපේක්ෂ දරිද්‍රතාවය යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද? එම පදනම මත රටක දිළිඳු ජනගහනයේ ප්‍රමාණය මණිනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 03 යි)

නිරපේක්ෂ දරිද්‍රතාවය යනු, “ මූලික අවශ්‍යතාවයන් ප්‍රමාණවත් කරමින් ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ආදායමක නොලැබීම, හේතුවෙන් ඇති වන දර්දූතාවයයි. ( කිසියයම් දරිද්‍රතා මට්ටමකට අදාළ අවම පරිභෝජන මට්ටමත් පවත්වා ගත නොහැකි වීමයි.)

අතීතයේ ආදායම පදනම් වුවත් වර්තමානයේ වියදම පදනම් කොට ගෙන එය දැක්වෙන්නේ, “අවම කැළරි ප්‍රමාණයවත් ලබා ගැනීමට අවශය , ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පරිභෝජන කටයුතු සඳහා වැයවන මාසික වියදම අනුව එය ඉටුකර ගත නොහැකි වීම, නිසා ඇතිවන දරිද්‍රතාවයයි.

(කුමන හෝ ආකාරයකට අර්ථ දැක්වීමට ලකුණු 02 යි.)

දරිද්‍රතාවය මණිනු ලබන්නේ, දරිද්‍රතා ඉමට අඩු පහළින් සිටින දිළිඳු ජනගහනය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමෙනි.

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතා ඉමට පහළ ජනගහනය}}{\text{මුළු ජනගහනය}} \times 100$$

( දරිද්‍රතා දර්ශකය ගණනය කිරීමේ ක්‍රමය හෝ ගණනය කරන ආකාරය දැක්වීමට ලකුණු 01 යි.)

(ආ)(i)කුටුම්භ අතර ආදායම් ව්‍යාප්තිය හා පංචමක අපකිරණ අනුපාතිකය යන සංකල්ප පැහැදිළි කරන්න. (ලකුණු 02යි)

කුටුම්භ අතර ආදායම් ව්‍යාප්තිය යනු "ආදායම් ලබන කුටුම්භ , ආදායම් මට්ටම් අනුව පෙළ ගස්වා (අරෝහණ හෝ අවරෝහණ) සමාන ප්‍රතිශතක වලට බෙදා එම එකි එකි කුටුම්භ ප්‍රතිශතට මුළු ආදාමින් හිමිවන ප්‍රතිශතය දැක්වීමයි. " (මෙම තත්ත්වය විකල්ප වචන වලින් ද දැක්විය හැකිය.)

උදා:- පහළම ආදායම් උපයන කුටුම්භ 10% මුළු ආදායමින් කොපමණ ප්‍රතිශතයක් ද

ඉහළම ආදායම් උපයන කුටුම්භ 10% මුළු ආදායමින් කොපමණ ප්‍රතිශතයක් ද

(ලකුණු 02 යි අර්ථ දැක්වීමට)

පංචමක අපකිරණ අනුපාතිකය යනු, ආදායම් උපයන්නන්ගේ ඉහළම ආදායම හිමිකර ගත් පංචමකයේ (පස්වන පංචමකයේ) සාමාන ආදායම පහළම ආදායම් උපා ගත් පංචමකයේ (පළමුවන පංචමකයේ) සාමාන්‍ය ආදායම අතර අනුපාතයයි.

පංචමක අපකිරණ අනුපාතය = ඉහළ ආදායම් උපයාගත් පංචමකයේ සාමාන්‍ය මාසික ආදායම 20% / පහළ ආදායම් උපයාගත් පංචමකයේ සාමාන්‍ය මාසික ආදායම 20%

(අර්ථ දැක්වීමට හෝ ගණනය කරන සූත්‍රයට ලකුනු 02)

(ii) ව්‍යුහමය සේවා වියුක්තිය යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද? (ලකුණු 02 යි.)

ව්‍යහුමය සේවා වියුක්තිය යනු, පුද්ගලයන් තුළ පවතින හැකියාවන් ,සහ පවත්නා රැකියාවන් අතර නොගැලපීම හේතුවෙන් ඇතිවන විරැකියාවයි. ආර්ථිකයක් වර්ධනය වීමේ දී හෝ සංවර්ධනය වීමක දී ආර්ථික ව්‍යුහය වෙනස් වන විට, ඇතැම් පිරිස් වලට රැකියා ආවස්ථා නොලැබීමෙන් ඇතිවන ස්වාභාවික සේවා වියුක්තිය මෙයින් අදහස් වේ.

උදා:- යතුරු ලියන හැකියාව තිබෙන ශ්‍රමිකයින් පරිඝණක භාවිතයට අදාළ යතුරු පුවරු වලට හුරු වන තෙක් විරැකියාවෙන් පසුවීම දැක්විය හැකිය.

(iii)ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීමේ අහිතකර ප්‍රතිවිපාත තවරේ ද? (ලකුණු 04 යි.)

ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීමේ ප්‍රතිවිපාක නම්,

- මුළු යැපුම් අනුපාතය ඉහළ යාම.
- විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය වියදම් ඉහළ යාම රජයේ අයවැයට අයහපත් බලපෑමක් ඇති කිරීම. (සමාජ ආරක්ෂණ වියදම් ඉහළ යාම. )
- වියපත් පුද්ගලයයන්ගේ ඉතුරුම් අඩුවීම ,( ආර්ථිකයේ ප්‍රාග්ධන සම්පාදනට අහිතකර බලපෑමක් ඇතිවීම.)

- වියයපත් පිරිස වැඩිවීමේ ප්‍රතිශතය ඉහළ යනවිට වැඩ කළ හැකි ජනගහනය අඩුවීම ශ්‍රම බලකායට අහිතකර ලෙස බලපෑම් ඇති වීම.
- වැඩිහිටි ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය ඉහළ යමින් පවතින නිසා ඔවුන් අසරණභාවයකට පත්වීම.
- ශ්‍රම සැපයුම අඩු වීම.

10. (i) ගෝලීය තරඟකාරිත්වය පිළිබඳ දර්ශකය, ගණනයට අදාළ ප්‍රධාන නිර්ණායකයන් කවරේ ද?

- ආයෝජනයට අවශ්‍ය මූලික අවශ්‍යතාවය.
- කාර්යක්ෂමතාව ඉහළ නංවන සාධක
- නව්‍යතා/ නවෝත්පාදන යන ප්‍රධාන කරුණු තුන ඔස්සේ නිර්ණායක 12 ක් සළකා බලයි. (ලකුණු 02 යි)

(ii) ගෝලීය ආර්ථික සංසදයේ නවතම වාර්තාව අනුව ඉදිරිපත් කරන නව ආර්ථිකය **((New Economy)** යන සංකල්පයෙන් අදහස් කරන්නේ කුමක් ද?

**නව ආර්ථිකය යන සංකල්යෙන් අදහස් කරනුයේ , කාර්මික ආර්ථිකයේ සිට තාක්ෂණය හා මානව ප්‍රාග්ධනය මත පදනම් වූ ආර්ථිකයට මාරුවීමයි.** (ලකුණු 02 යි)

**එහි ප්‍රධාන ලක්ෂණ වනුයේ,**

- කෘතිම බුද්ධිය.
- තිරසාර් සංවර්ධනය.
- ගෝලීය ආර්ථික වෙනස්වීම් (ලකුණු 02 යි)

(iii)සමාජ ආරක්ෂනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැයි දක්වා ශ්‍රී ලංකාවේ දැනට දැක ගත හැකි සමාජ ආරක්ෂණ වැඩ සටහන් තුනක් ලියන්න.

සමාජ ආර්කෂණය යන්නෙන් අදහස් වන්නේ ළමයින් . වියපත් වූවන් ආබාධිතයන් අවතැන් වූවන් , සේවා වියුක්තිකයන් සහ රෝගීන් වැනි දිළිදු සහ ආරක්ෂිත තත්වයයක සිටින්නන් රැක බලා ගැනීමට සහ උපකාරප කිරීමට පවත්නා වැඩ පිළිවෙළකි. (ලකුණු 02 යි)

- ✓ සමෘද්ධි/ අස්වැසුම, දිළිඳු සහන වැඩ සටහන්.
- ✓ ආබාධිත සොල්දාදුවන්ට හා යුධ ගැටුම් වලින් මිය ගිය ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ පවුල් වලට ලබා දෙන මූල්‍ය ආධාර.
- ✓ ආබාධිත පුද්ගලයන්ට ලබා දෙන මාසික දීමනා.
- ✓ වැඩිහිටි මාසික දීමනා.
- ✓ මහජන ආධාර මාසික දීමනාව./ මාසික පිංපඩි
- ✓ ත්‍රිපෝෂ ආහාර ආධාර සහ පෝෂණ මල්ල්

Past Papers Wiki

- ✓ ළදරු පාසල් දරුවන්ට ආහාර හා නැවුම් කිරි ලබාදීම.
- ✓ නියඟය, ගංවතුර, සුළි සුළං සහ ස්වාභාවික වසංගත වලින් පීඩාවට පත් ජනතාවට ලබා දෙන හදිසි ආධාර

(ලියා ඇති ඕනෑම වැඩ සටහන තුනකට ලකුනු 02 කි)

(iv) වර්තමාන ශ්‍රී ලංකා රාජ්‍යයේ ආර්ථික ප්‍රතිපත්තියේ ඉටු කර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන ස්ථම්භ තුන කවරේ ද?

- ❖ පිරිසිදු ශ්‍රී ලංකාව (clean Sri lanka)
- ❖ ඩිජිටල්කරණය
- ❖ දරිද්‍රතාවය / දුප්පත් කම තුරන් කිරීම. (කරුණු 3 ට ලකුනු 04 යි.)

(v) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටළු පවතින බව නිතර අසන්නට ලැබෙයි.එසේ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව පවත්නා ගැටළු කවරේ ද? (ලකුණු 4 x 5 යි)

- ▪ ජල කළමණාකරණය දුර්වල වීම.(වාරිමාර්ග පහසුකම් වල දුර්වලතා)
- ▪ ස්වභාවික විපත් වලට මුහුණ දීමට සිදුවීම. (නියඟය, ජල ගැලීම්, කෘමි උවදුරු වන සතුන්)
- ▪ තාක්ෂණ භාවිතය පසුගාමී වීම.
- ▪ අදාළ කාලයට පොහොර ලබා ගැනීමට නොහැකි වීම.
- ▪ අළෙවිකරණය ආශ්‍රිත ගැටළු පැවතීම.( වී අළෙවි මණ්ඩලය වැනි ආයයතන වල අකාර්යක්ෂක්ම තාවය.)
- ▪ පසු අස්වනු හානි බහුලව සිදුවීම.
- ▪ පොහොර සහනාධාරය වෙනුවට මූල්‍ය ආධාර ලබාදීම
- ▪ ව්‍යාප්ති සේවාවන් වල දුර්වලතා දැකගත හැකි වීම.
- ▪ අනාරක්ෂිත බිම් කැබලි වල වගා කටයුතු කිරීම.
- ▪ ග්‍රාමීය මට්ටමින් කෘෂිකර්මාන්ත පදනම් කරගත් කර්මාන්ත ප්‍රමාණවත්ව බිහි නොවීම. (ලකුනු 04 යි.)

☸☸☸



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## බහු වරණ පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 11 | 4 | 21 | 1 | 31 | 1 | 41 | 5 |
| 2 | 4 | 12 | 1 | 22 | 2 | 32 | 3 | 42 | 1 |
| 3 | 3 | 13 | 4 | 23 | 4 | 33 | 4 | 43 | 4 |
| 4 | 4 | 14 | 4 | 24 | 2 | 34 | 4 | 44 | 1 |
| 5 | 1 | 15 | 2 | 25 | 3 | 35 | 3 | 45 | 2 |
| 6 | 4 | 16 | 3 | 26 | 2 | 36 | 5 | 46 | 3 |
| 7 | 5 | 17 | 5 | 27 | 4 | 37 | 5 | 47 | 1 |
| 8 | 2 | 18 | 4 | 28 | 4 | 38 | 5 | 48 | 3 |
| 9 | 2 | 19 | 4 | 29 | 1 | 39 | 1 | 49 | 3 |
| 10 | 1 | 20 | 3 | 30 | 5 | 40 | 3 | 50 | 5 |

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank